අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යාපනයේ නව දැක්ම
# හා
# ප්‍රගතියේ පිය සටහන්

# 2021/2022

## (පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය)



අතිගරු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා



ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා



ගරු අධ්‍යාපන අමාත්‍ය
දිනේෂ් ගුණවර්ධන මැතිතුමා

# දැක්ම

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

# මෙහෙවර

පාර්ශවකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද නව්‍ය ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

# පටුන

## 01. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය භාරය


1.1 විෂය පථය 01
1.2 කාර්යයන් හා කර්තව්‍යයන් 01
1.3 සුවිශේෂී ප්‍රමුඛතා 01
1.4 අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් ( 2020) 02


## 02. අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ


2.1 සෞභාග්‍යයේ දැක්ම හා බැඳුණු අධ්‍යාපනයේ නව දැක්ම 09
2.2 පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයක් ඇරඹීම 10
2.3 ජාතික පාසල් සංඛ්‍යාව 1,000 ක් ලෙස වර්ධනය කිරීම හා පොකුරු පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන හා ත්‍රෛභාෂික, ද්විතියික ආදර්ශ පාසල් 20 ක් දිස්ත්‍රික්ක මට්ටමෙන් ස්ථාපනය කිරීම 11
2.4 දිස්ත්‍රික් මට්ටමින් අධ්‍යාපන සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ගැටළු විසඳීම 14


## 03. 2022 වර්ෂය සඳහා වූ ප්‍රධාන ඉලක්ක


3.1 2022 වර්ෂය සඳහා වූ ප්‍රධාන ඉලක්ක 15


## 04. 2021 වර්ෂයේ ප්‍රගතිය


4.1 එක් එක් විෂයය ක්ෂේත්‍රය යටතේ ළඟා කර ගත් ප්‍රගතිය (2021.08.31 දිනට) 19


## 05. විදේශාධාර යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘති


5.1. තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය 41
5.2. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ( GEMP) 42
5.3. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 45
5.4. ද්විතියික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ( ICT Hubs) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 46
5.5 පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය විද්‍යාලය සංවර්ධනය කිරීම 46
5.6 යුනෙස්කෝ ආධාර ලබන වැඩසටහන් - ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව 47
5.7 යුනිසෙෆ් හා අධ්‍යාපන අමාත්‍යාංශය අතර සහයෝගිතා වැඩසටහන 48
5.8 තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම හා ගුරු පුහුණු ක්‍රමවේදයක් ගොඩනැගීම 49
5.9 පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ත්‍රෛභාෂා පාසලක් ආරම්භ කිරීම 50
5.10 වතුකර ප්‍රදේශවල පාසල් නගාසිටුවීම 50
5.11 ද්විතීයික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP) 51


## 06. කෝවිඩ් -19 වසංගත තත්වය හමුවේ දරුවන්ගේ අධ්‍යාපනය පසුබෑමට ලක් නොවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග


6.1 කෝවිඩ් -19 වසංගත තත්වය හමුවේ දරුවන්ගේ අධ්‍යාපනය පසුබෑමට ලක් නොවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග 55

## 07. මූල්‍ය ප්‍රගතිය

7.1 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් ( 2021.08.31 දිනට) 59
7.2 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් ( 2021.08.31 දිනට) 60

## 08. ශිෂ්‍ය සාධනය

8.1 පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය 61
8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය 61
8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය 62

## 09. අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

9.1 ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය 65
9.2 ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව 66
9.3 රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව 68
9.3 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 70

# 01. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

## 1.1 විෂය පථය

දැනුම පදනම් කරගත් සමාජීය හා ආර්ථික සංවර්ධන මට්ටමක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා, තිරසර අධ්‍යාපන ක්‍රමෝපායයන් තුළින් ළමා මිතුරු, ගුණාත්මක ප්‍රාථමික හා ද්විතීයීක අධ්‍යාපන අවස්ථා සහ නවෝත්පාදන පදනම් කරගත් විශිෂ්ට උසස් අධ්‍යාපන අවස්ථා දරු පරපුර වෙත විවෘත කර දීම.

## 1.2 කාර්යයන් හා කර්තව්‍යයන්

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අනෙකුත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීම් සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යභාරයන් ඉටු කිරීම.

## 1.3 සුවිශේෂී ප්‍රමුඛතා (පාසල් අධ්‍යාපන අංශය)

- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම් සිදු කිරීම.
- සෑම දරුවකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය තහවුරු වන ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම.
- පාසල් ගුරුවරුන්ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම.
- පාසල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිස්ථානගත කිරීම.
- ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම.
- විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමග වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# 1.4 පාසල් පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් (2020)

### රජයේ මුළු පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 10,155 | 249,494 | 4,063,685 |

### පාසල් වර්ගීකරණය හා පරිපාලනය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | | ශිෂ්‍ය සංඛ්‍යාව | | ගුරුවරු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | ජාතික පාසල් | පළාත් පාසල් | ජාතික පාසල් | පළාත් පාසල් | ජාතික පාසල් | පළාත් පාසල් |
| 1AB වර්ගය | 348 | 652 | 776,994 | 793,646 | 40,110 | 42,134 |
| 1C වර්ගය | 24 | 1,908 | 19,789 | 1,056,840 | 1,415 | 66,422 |
| 2 වර්ගය | 1* විශේෂිත පාසලකි | 3,223 | 29 | 750,697 | 13 | 61,715 |
| 3 වර්ගය | - | 3,999 | - | 665,690 | - | 37,685 |

### පළාත අනුව රජයේ පාසල් වර්ගීකරණය

| පළාත | ජාතික පාසල් | යෝජිත ජාතික පාසල් | පළාත් පාසල් | මුළු රජයේ පාසල් |
|---|---|---|---|---|
| බස්නාහිර | 74 | 160 | 1,121 | 1,355 |
| මධ්‍යම | 54 | 125 | 1,339 | 1,518 |
| දකුණ | 67 | 94 | 946 | 1,107 |
| උතුර | 22 | 51 | 912 | 985 |
| නැගෙනහිර | 40 | 71 | 1,004 | 1,115 |
| වයඹ | 37 | 103 | 1,105 | 1,245 |
| උතුරු මැද | 15 | 54 | 746 | 815 |
| ඌව | 36 | 70 | 790 | 896 |
| සබරගමුව | 28 | 103 | 988 | 1,119 |
| මුළු එකතුව | 373 | 831 | 8,951 | 10,155 |

මූලාශ්‍රය : පාසල් සංගණනය - 2020

පාසලේ පන්ති පරාසය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පන්ති පරාසය | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-5 | 3,884 | 36,432 | 649,719 |
| 1-8 | 115 | 1,253 | 15,971 |
| 1-11 | 3,204 | 61,462 | 748,139 |
| 1-13 | 1,949 | 95,322 | 1,705,640 |
| 6-11 | 20 | 266 | 2,587 |
| 6-13 | 983 | 54,759 | 941,629 |

කලාපය අනුව රජයේ පාසල් වර්ගීකරණය

| පළාත | පරිපාලන දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | ජාතික පාසල් | යෝජිත ජාතික පාසල් | පළාත් පාසල් | මුළු පාසල් |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | කොළඹ | 21 | 13 | 90 | 124 |
| | | හෝමාගම | 4 | 12 | 83 | 99 |
| | | පිළියන්දල | 4 | 9 | 74 | 87 |
| | | ශ්‍රී ජයවර්ධනපුර | 8 | 7 | 74 | 89 |
| | ගම්පහ | ගම්පහ | 6 | 18 | 121 | 145 |
| | | කැලණිය | 6 | 14 | 95 | 115 |
| | | මිණුවන්ගොඩ | 3 | 17 | 139 | 159 |
| | | මීගමුව | 4 | 17 | 96 | 117 |
| | කළුතර | හොරණ | 5 | 18 | 114 | 137 |
| | | කළුතර | 11 | 21 | 120 | 152 |
| | | මතුගම | 2 | 14 | 115 | 131 |
| මධ්‍යම | නුවර | දෙනුවර | 4 | 9 | 74 | 87 |
| | | ගම්පොළ | 6 | 17 | 120 | 143 |
| | | නුවර | 9 | 17 | 90 | 116 |
| | | කටුගස්තොට | 10 | 5 | 107 | 122 |
| | | තෙල්දෙනිය | 3 | 6 | 88 | 97 |
| | | වත්තේගම | 3 | 11 | 72 | 86 |
| | මාතලේ | ගලේවෙල | 2 | 10 | 97 | 109 |
| | | මාතලේ | 9 | 10 | 102 | 121 |
| | | නාවුල | 1 | 2 | 36 | 39 |
| | | විල්ගමුව | - | 5 | 43 | 48 |
| | නුවරඑළිය | හඟුරන්කෙත | 2 | 4 | 63 | 69 |
| | | හැටන් | - | 12 | 138 | 150 |
| | | කොත්මලේ | 3 | 3 | 80 | 86 |
| | | නුවරඑළිය | 1 | 10 | 145 | 156 |
| | | වලපනේ | 1 | 4 | 84 | 89 |

| පළාත | පරිපාලන දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | ජාතික පාසල් | යෝජිත ජාතික පාසල් | පළාත් පාසල් | මුළු පාසල් |
|---|---|---|---|---|---|---|
| දකුණ | ගාල්ල | අම්බලන්ගොඩ | 5 | 8 | 69 | 82 |
| | | ඇල්පිටිය | 3 | 9 | 111 | 123 |
| | | ගාල්ල | 18 | 16 | 111 | 145 |
| | | උඩුගම | 3 | 7 | 69 | 79 |
| | මාතර | අකුරැස්ස | 2 | 9 | 67 | 78 |
| | | මාතර | 13 | 8 | 90 | 111 |
| | | මොරවක | 4 | 7 | 67 | 78 |
| | | මුලටියන(හක්මන) | 3 | 7 | 81 | 91 |
| | හම්බන්තොට | හම්බන්තොට | 7 | 12 | 103 | 122 |
| | | තංගල්ල | 5 | 6 | 96 | 107 |
| | | වලස්මුල්ල | 4 | 5 | 82 | 91 |
| නැගෙනහිර | යාපනය | දිවයින් | - | 4 | 60 | 64 |
| | | යාපනය | 4 | 4 | 92 | 100 |
| | | තෙන්මාරච්චි | 1 | 2 | 55 | 58 |
| | | වඩමාරච්චි | 1 | 6 | 74 | 81 |
| | | වලිකාමම් | 1 | 10 | 134 | 145 |
| | මන්නාරම | මඩු | - | 2 | 49 | 51 |
| | | මන්නාරම | 5 | 5 | 72 | 82 |
| | වවුනියාව | වවුනියාව උතුර | - | 2 | 74 | 76 |
| | | වවුනියාව දකුණ | 5 | 3 | 89 | 97 |
| | මුලතිව් | මුලතිව් | 2 | 3 | 61 | 66 |
| | | තුනුක්කායි | 1 | 4 | 56 | 61 |
| | කිලිනොච්චි | කිලිනොච්චි | 2 | 6 | 96 | 104 |
| නැගෙනහිර | මඩකලපුව | අම්පාර | - | - | 1 | 1 |
| | | මඩකලපුව | 4 | 4 | 57 | 65 |
| | | මඩකලපුව මධ්‍යම | 6 | 5 | 65 | 76 |
| | | මඩකලපුව බස්නාහිර | - | 4 | 64 | 68 |
| | | කල්කුඩා | 1 | 6 | 76 | 83 |
| | | පදිරිප්පු | 2 | 3 | 64 | 69 |
| | අම්පාර | අක්කරෙයිපත්තු | 3 | 5 | 64 | 72 |
| | | අම්පාර | 3 | 7 | 90 | 100 |
| | | දෙහිඅත්තකණ්ඩිය | 1 | 2 | 44 | 47 |
| | | කල්මුණේ | 3 | 9 | 53 | 65 |
| | | මහඔය | 1 | 1 | 38 | 40 |
| | | සමන්තුරේ | 3 | 5 | 63 | 71 |
| | | තිරුක්කෝවිල් | 2 | 1 | 42 | 45 |
| | ත්‍රිකුණාමලය | කන්තලේ | 1 | 5 | 37 | 43 |
| | | කින්නියා | 3 | 1 | 62 | 66 |

| පළාත | පරිපාලන දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | ජාතික පාසල් | යෝජිත ජාතික පාසල් | පළාත් පාසල් | මුළු පාසල් |
|---|---|---|---|---|---|---|
| | | මුතූර් | 1 | 4 | 84 | 89 |
| | | ත්‍රිකුණාමලය | 6 | 5 | 70 | 81 |
| | | ත්‍රිකුණාමලය උතුර | - | 4 | 30 | 34 |
| වයඹ | කුරුණෑගල | ගිරිඋල්ල | 8 | 7 | 122 | 137 |
| | | ඉබ්බාගමුව | 2 | 9 | 98 | 109 |
| | | කුලියාපිටිය | 5 | 11 | 150 | 166 |
| | | කුරුණෑගල | 7 | 16 | 96 | 119 |
| | | මහව | 5 | 11 | 172 | 188 |
| | | නිකවැරටිය | 3 | 12 | 139 | 154 |
| | පුත්තලම | හලාවත | 4 | 18 | 137 | 159 |
| | | පුත්තලම | 3 | 19 | 191 | 213 |
| උතුරු මැද | අනුරාධපුර | අනුරාධපුර | 3 | 12 | 123 | 138 |
| | | ගලෙන්බිඳුණුවැව | - | 6 | 89 | 95 |
| | | කැබිතිගොල්ලෑව | 1 | 6 | 120 | 127 |
| | | කැකිරාව | 1 | 9 | 120 | 130 |
| | | තඹුත්තේගම | 1 | 6 | 65 | 72 |
| | පොළොන්නරුව | දිඹුලාගල | 1 | 5 | 98 | 104 |
| | | හිඟුරක්ගොඩ | 5 | 4 | 86 | 95 |
| | | පොළොන්නරුව | 3 | 6 | 45 | 54 |
| ඌව | බදුල්ල | බදුල්ල | 6 | 6 | 100 | 112 |
| | | බණ්ඩාරවෙළ | 10 | 10 | 124 | 144 |
| | | මහියංගනය | 2 | 8 | 71 | 81 |
| | | පස්සර | 2 | 6 | 80 | 88 |
| | | වියළුව | 3 | 4 | 63 | 70 |
| | | වැලිමඩ | 4 | 7 | 99 | 110 |
| | මොනරාගල | බිබිලේ | 2 | 9 | 71 | 82 |
| | | මොනරාගල | 3 | 9 | 97 | 109 |
| | | තණමල්විල | 2 | 6 | 35 | 43 |
| | | වැල්ලවාය | 2 | 5 | 50 | 57 |
| සබරගමුව | රත්නපුර | බලංගොඩ | 2 | 12 | 119 | 133 |
| | | ඇඹිලිපිටිය | 3 | 15 | 109 | 127 |
| | | නිවිතිගල | 2 | 9 | 135 | 146 |
| | | රත්නපුර | 7 | 28 | 157 | 192 |
| | කෑගල්ල | දෙහිඕවිට | 4 | 15 | 203 | 222 |
| | | කෑගල්ල | 6 | 13 | 143 | 162 |
| | | මාවනැල්ල | 4 | 11 | 122 | 137 |

පාසලේ ශිෂ්‍ය සංඛ්‍යා පරාසය අනුව පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-50 | 1,439 | 9,021 | 42,792 |
| 51-100 | 1,523 | 15,423 | 113,125 |
| 101-200 | 2,169 | 30,533 | 317,607 |
| 201-500 | 2,690 | 58,225 | 863,229 |
| 501-1000 | 1,404 | 52,908 | 972,049 |
| 1001-1500 | 398 | 24,243 | 480,791 |
| 1501-2000 | 215 | 18,117 | 368,325 |
| 2001-3000 | 212 | 23,458 | 506,501 |
| 3001- 4000 | 73 | 10,927 | 248,472 |
| 4000ට වැඩි | 32 | 6,639 | 150,794 |

ඉගෙනුම් මාධ්‍ය අනුව රජයේ පාසල් සංඛ්‍යාව

| ඉගෙනුම ලබන මාධ්‍ය | පාසල් සංඛ්‍යාව |
|---|---|
| සිංහල පමණක් | 6,357 |
| දෙමළ පමණක් | 3,042 |
| සිංහල හා දෙමළ | 42 |
| සිංහල හා ඉංග්‍රීසි | 524 |
| දෙමළ හා ඉංග්‍රීසි | 157 |
| සිංහල, දෙමළ හා ඉංග්‍රීසි | 33 |

අ.පො.ස.(උසස් පෙළ)එක් එක් විෂය ධාරාව සහිත රජයේ පාසල් සංඛ්‍යාව

| විෂය ධාරාව | පාසල් සංඛ්‍යාව |
|---|---|
| විද්‍යා විෂය ධාරාව සහිත මුළු පාසල් | 1,000 |
| ජීව විද්‍යා | 957 |
| භෞතික විද්‍යා | 920 |
| කලා | 2,910 |
| වාණිජ | 1,871 |
| තාක්ෂණ (ජෛව තාක්ෂණය/ ඉංජිනේරු තාක්ෂණය) | 512 |
| වෘත්තීය විෂයධාරාව | 421 |
| පොදු විෂයධාරා | 61 |

පත්වීම් ස්වභාවය අනුව රජයේ පාසල්වල ගුරුවරු සංඛ්‍යාව

| පත්වීම් ස්වභාවය | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---|---|---|
| උපාධිධාරී | 88,955 | 32,614 | 121,569 |
| පුහුණුව ලත් | 93,924 | 27,872 | 121,796 |
| පුහුණුවන | 3,666 | 859 | 4,525 |
| නුපුහුණු | 1,099 | 373 | 1,472 |
| වෙනත් | 103 | 29 | 132 |
| එකතුව | 187,747 | 61,747 | 249,494 |

පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 90 | 8,019 | 136,230 |

පිරිවෙන් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පිරිවෙන් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ගිහි හා පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 816 | 7,336 | 69,878 |

| කලාප කාර්යාල සංඛ්‍යාව | කොට්ඨාස කාර්යාල සංඛ්‍යාව |
|---|---|
| 99 * | 312 |

* කිලිනොච්චිය කලාප කාර්යාලය 100 වන කලාප කාර්යාලය ලෙස ස්ථාපනය කිරීමට නියමිතය.









# 02. අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ

## 2.1 සෞභාග්‍යයේ දැක්ම හා බැඳුනු අධ්‍යාපනයේ නව දැක්ම

සතුට සපිරි පවුලක්, ඵලදායී පුරවැසියෙක්, විනය ගරුක සමාජයක් සහ සෞඛ්‍ය සම්පන්න අනාගත පරපුරක් යන චතුර්විධ අරමුණු ජය ගනිමින් සෞභාග්‍යමත් රටක් නිර්මාණය කිරීම ශ්‍රී ලංකාවේ නව දැක්ම "සෞභාග්‍යයේ දැක්ම" තුළින් පිළිබිඹු වන අපේක්ෂාවයි.

සෞභාග්‍යයේ දැක්ම සමස්තයක් ලෙස රටේ මානව සම්පත සෑම අතින්ම ඉහළ තලයකට ගෙනයාම සඳහා අද්විතීය ක්‍රමෝපායයන් යෝජනා කරන අතර එහි දී අධ්‍යාපනය සඳහා ලබා දී ඇත්තේ ඉතා ඉහළ ම ප්‍රමුඛතාවයකි.

ඉහත චතුර්විධ අරමුණු කරා යාමේ දී ඒ වටා මැනවින් පෙළ ගැසුණු දස ප්‍රතිපදා අතරින් පහත සඳහන් ප්‍රතිපදා ඉතා සෘජුව හා තදින් අධ්‍යාපනය හා සබැඳේ.

- ඵලදායී පුරවැසියෙක්
- සක්‍රීය මානව සම්පතක්
- තිරසාර පරිසර කළමනාකරණයක්
- තාක්ෂණය මත පදනම් වන සමාජයක්
- විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක්

රටේ අනාගත ජීවනාලිය වන දරු පරපුර සතු විශිෂ්ට විභව කුසලතා ඔප් නංවාලීමට සමත් වන පරිදි, ඔවුන් නව දැනුමෙන් පෝෂණය කිරීම, ඔවුන් සතු නිපුණතා සංවර්ධනය කිරීම හා ඔවුන් තුළ මනෝ සමාජීය කුසලතා හා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් සේ අධ්‍යාපන අමාත්‍යාංශය වටහා ගෙන ඇති අතර විශ්ව ගම්මානයේ විශිෂ්ටත්වය කරා යොමු කෙරෙන නීරෝගීමත් හා සවිබලැති මානව ප්‍රාග්ධනයක් උත්පාදනය කිරීම සඳහා දැවැන්ත අඩිතාලමක් සැපයීම සාමාන්‍ය අධ්‍යාපනයේ පුළුල් අරමුණ ලෙස ගෙන ඒ සඳහා ඉදිරි ගමන් මඟ සැලසුම් කිරීමට පියවර ගෙන ඇත.

## 2.2 පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයක් ඇරඹීම

අධ්‍යාපන අමාත්‍යාංශය හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විශ්ව විද්‍යාල සහ දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව පෙර පාසල් අධ්‍යාපනය, පරිපාලන ප්‍රතිසංස්කරණය, විෂයමාලා ප්‍රතිසංස්කරණය, සෞඛ්‍ය පළමුව, ජාතික පාසල් 1000+ සංකල්පය, වෘත්තීය සංවර්ධනය, වෘත්තීය අධ්‍යාපනයට පිවිසීමට පාලමක් සෑදීම, දුරස්ථ අධ්‍යාපනය ප්‍රචලිත කිරීම, උසස් අධ්‍යාපනය යන ක්ෂේත්‍ර ඔස්සේ ඉදිරි අධ්‍යාපනයේ පුළුල් ප්‍රතිසංස්කරණයක් සිදුකරනු ලබයි. ඒ අනුව

- ගුරුගෙදර රූපවාහිනී වැඩසටහන, e - තක්සලාව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම, ඥානස රූපවාහිනී වැඩසටහන් ආරම්භය හා ජාතික විකාශන කේන්ද්‍රය (National Streaming Hubs) ආරම්භ කිරීම සිදු කර ඇත.

- ජාතික අධ්‍යාපන පද්ධතිය සැකසීමට අදාළ ව නව විෂයමාලා රාමුවක් සැකසීම, නව ඇගයීම් රාමුවක් සැකසීම, ජාතික ගුරු නිපුණතා රාමුව සැකසීම, නිවෙස් පාදක අධ්‍යාපන මොඩියුල සැකසීම යන කාරණා මේ වන විට සිදු කෙරෙමින් පවතී.

- පරිපාලන ව්‍යුහයේ නව ප්‍රතිසංස්කරණය, සෞඛ්‍ය පළමුව ප්‍රතිපත්තිය හා වෘත්තීය අධ්‍යාපනයට පාලමක් සඳහා වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සකස් කරමින් පවතී.

- තවද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්ව විද්‍යාල බවට උසස් කිරීමට අදාළ ව උපාධි පාඨමාලා 05ක් මේ වන විට සකස් කර ඇත.

- ජාතික පාසල් 1000ක් සංවර්ධනය කිරීම යටතේ තෝරාගත් පාසල් සහ දැනට පවත්නා ජාතික පාසල් සියල්ල සඳහා පාසල් සංවර්ධන සැලැසුම් සකස් ඇත. එම පාසල්වලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සපයා දීම සඳහා ඉදිරි ආයෝජන සැලසුම් සකස් කර ඇත.

## 2.3 ජාතික පාසල් සංඛ්‍යාව 1,000+ ක් ලෙස වර්ධනය කිරීම හා පොකුරු පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන හා ත්‍රෛභාෂික, ද්විතියික ආදර්ශ පාසල් 20 ක් දිස්ත්‍රික්ක මට්ටමෙන් ස්ථාපනය කිරීම

### 2.3.1 ජාතික පාසල් සංඛ්‍යාව 1,000+ක් ලෙස වර්ධනය කිරීම හා පොකුරු පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

හැඳින්වීම

'සෞභාග්‍යයේ දැක්ම' රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, 'පාසල් අධ්‍යාපනයේ නවෝදය' වැඩසටහන යටතේ, ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්ති යෝජනා අතර දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් ඉලක්කකර ගනිමින් රටේ අනාගත ආර්ථික සහ සමාජයීය සංවර්ධනය සඳහා උපකාරීවන ජාතික පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා වැඩි දියුණු කිරීම, ප්‍රමුඛ වැඩසටහනක් ලෙස හඳුනාගෙන ඇත.

දැනට ජාතික පාසල් කිසිවක් නොමැති සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අවම වශයෙන් එක් පාසලක්වත් ජාතික පාසලක් ලෙස උසස් කිරීම සහ මුළු ජාතික පාසල් සංඛ්‍යාව 1000+ වන පරිදි, නිර්ණායක මත පදනම් ව තෝරාගත් තවත් පාසල් ජාතික පාසල් ලෙස උසස් කිරීම මෙහි ඇතුළත් වේ.

අරමුණු සහ පාසල් තෝරා ගැනීමේ ක්‍රමවේදය

සෑම දරුවෙකුටම ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා සමාන අවස්ථා ලබා දීමේ දී, නිර්ණායක හා සම්මතයන්ට අනුව ඉගෙනුම්-හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම, ජාතික පාසල් සංඛ්‍යාව 1000ක් දක්වා වැඩි දියුණු කිරීම වැඩසටහනෙහි ප්‍රමුඛ අභිමතාර්ථය වේ.

මෙම වැඩසටහන සඳහා, පාසල් සිතියම්කරණ ක්‍රමවේදයන් අනුව, ජනගහන හා ශිෂ්‍ය ඝනත්වයන්, භූගෝලීය විද්‍යාත්මක සාධක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව පාසල්වල විසිරීම හා එම පාසල්වල පවත්නා භෞතික හා මානව සම්පත්, ප්‍රවේශ පහසුකම්, ගමනා ගමන පහසුකම් යනාදී නිර්ණායක 10ක් ඔස්සේ පාසල් තෝරාගන්නා ලදී.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුගත වෙමින් මෙම වැඩසටහන යටතේ 2021 සිට 2023 දක්වා වසර තුනක කාලයක් තුළ, පහත සඳහන් සංරචක යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

පාසල් තෝරාගැනීමේ නිර්ණායක

I. අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා හා සහභාගීත්වය (access to and participation in education).
II. ශිෂ්‍ය ගලනය (student flow).
III. යටිතල පහසුකම් පුළුල් කිරීමේ ශක්‍යතාව (feasibility for expanding of infrastructure facilities).
IV. අ.පො.ස. ( උ.පෙළ) ශිෂ්‍ය ගලනය හා ශිෂ්‍ය ජනගහනය (student flow and student population of GCE A/L )
V. ත්‍රෛභාෂා මාධ්‍ය ඉගෙනුම් සඳහා පහසුකම් (possibility to implement trilingual study facilities)
VI. සමාජ-ආර්ථික සාධක (socio-economic factors).
VII. පාසල් ජාලයට අයත් වන ප්‍රාථමික හා ද්වීතියික පාසල්වල ශිෂ්‍ය ජනගහනය (3 වර්ගයේ

හා 2 වර්ගයේ) [(student population in primary and secondary schools in the school network) (Type 2 & Type 3)].

VIII. පාසල් ජාලය තුළ තිබිය යුතු පාසල් සංඛ්‍යාව (number of schools per network).

IX. ප්‍රධාන කේන්ද්‍රීය පාසලෙහි ශිෂ්‍ය සංඛ්‍යාව (school size of the core school in the network).

X. ප්‍රධාන කේන්ද්‍රීය පාසල සඳහා දැනටමත් සිදුකර ඇති රාජ්‍ය ආයෝජන (කුමන කරුණු අරභයාද / මූල්‍ය ආයෝජන රුපියල් මිලියන කොපමණ ද යන්න සහිතව) (public investments so far made for the core school of the network).

ප්‍රගතිය

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති යෝජනා සකස්කර, ඒවා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා ගෙන ඇත.
- අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන බලධාරීන් එක්ව නිර්ණායක හා සිතියම්කරණ අභ්‍යාස හරහා සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පාසල් තෝරාගෙන ඇත. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් නිර්දේශ කරන ලද මෙම පාසල් සඳහා ගරු පළාත් ආණ්ඩුකාරවරුන්ගේ අනුමැතිය ලැබී ඇත.

පළාත් වශයෙන් හඳුනාගෙන ඇති පාසල් සංඛ්‍යාව

| අනු අංකය | පළාත | යෝජිත නව ජාතික පාසල් සංඛ්‍යාව | දැනට ඇති ජාතික පාසල් සංඛ්‍යාව | ඒ අනුව යෝජිත මුළු ජාතික පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර | 160 | 74 | 234 |
| 02 | මධ්‍යම | 125 | 54 | 179 |
| 03 | දකුණ | 94 | 67 | 161 |
| 04 | උතුර | 51 | 22 | 73 |
| 05 | නැගෙනහිර | 71 | 40 | 111 |
| 06 | වයඹ | 103 | 37 | 140 |
| 07 | උතුර මැද | 54 | 15 | 69 |
| 08 | ඌව | 70 | 36 | 106 |
| 09 | සබරගමුව | 103 | 28 | 131 |
| එකතුව | | 831 | 373 | 1,204 |

- මෙම වැඩසටහනට 2021 වර්ෂය සඳහා රු. මිලියන 1,950 ක මුදලක්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් වී ඇත. එම අරමුදල් අතරින් මේ වනවිට තෝරා ගෙන ඇති පාසල් සඳහා,
    - ♦ පාසල් පිරියත වැඩි දියුණු කිරීම හා සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 1.00ක් බැගින්ද
    - ♦ ඉගෙනුම් උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 1.00ක් බැගින් ද ප්‍රතිපාදන ලබා දී ඇත.
- මෙම පාසල්වල අවශ්‍ය විෂයානුබද්ධ පහසුකම් හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපන පහසුකම් මෙන්ම අනෙකුත් භෞතික අවශ්‍යතා තෘප්ත කිරීමට අදාලව පාසල් පාදක සැලසුම් සම්පාදනය කිරීම ඇතුළු කළමනාකරණ ධාරිතා සංවර්ධනය සම්බන්ධයෙන් අධ්‍යයන

- පාසල්වල සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා පාසල් පාදක සැලසුම් සකස් කර සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවමින් පවතී.
- 2022 හා 2023 වර්ෂ සඳහා අවශ්‍ය අයවැය ඇස්තමේන්තු සකස් කර ඇත.

## පොකුරු පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

හැඳින්වීම

'සෞභාග්‍යයේ දැක්ම' රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, 'පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම' වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රමුඛ ප්‍රතිපත්ති යෝජනාවකි.

සියලු භෞතික හා මානව පහසුකම්වලින් සම්පූර්ණ පාසල් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ම ආවරණය වන පරිදි පිහිටුවා ඒවා ජාතික පාසල් ලෙස උසස් කර ප්‍රාදේශීයව පිහිටි අනෙකුත් පාසල් දරුවන්ට එම පහසුකම් භුක්ති විඳීම සඳහා පොකුරු පාසල් ක්‍රමයක් බිහි කිරීම අරමුණු කොට ඇත.

ප්‍රගතිය

- දිවයිනේ සියලුම පාසල් කේන්ද්‍රීය පාසල් වටා ගොනු ගත වන අයුරින් සිතියම් ගත අභ්‍යාසයක් ඇසුරින් පාසල් පොකුරු හඳුනා ගෙන ඇත.
- මෙම වැඩසටහනට 2021 වර්ෂය සඳහා රු. මිලියන 400ක මුදලක්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් වී ඇත. පොකුරු පාසල් සංවර්ධනය ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇති අතර ඒ අනුව වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.
- 2022 හා 2023 වර්ෂ සඳහා අවශ්‍ය අයවැය ඇස්තමේන්තු සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත

## 2.3.2 ත්‍රෛභාෂික, ද්විතියික ආදර්ශ පාසල් 20 ක් දිස්ත්‍රික්ක මට්ටමෙන් ස්ථාපනය කිරීම

හැඳින්වීම

දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකටම අවම වශයෙන් "ත්‍රෛභාෂික, අග්‍රගණ්‍ය සුපිරි ජාතික පාසලක්" බැගින් හිමිවන ද්විතියික ආදර්ශ පාසල් 20 ක් ස්ථාපනය කිරීම 'සෞභාග්‍යයේ දැක්ම' රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, 'පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම' වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රමුඛ ප්‍රතිපත්ති යෝජනාවකි.

ප්‍රගතිය

- රත්නපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල නව පාසල් පිහිටුවීම සඳහා ස්ථාන හඳුනා ගෙන ඇත. අදාළ ව්‍යාපෘති යෝජනා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
- දැනට පවත්නා පාසල් අතුරින් තෝරා ගත් පාසල් අවශ්‍ය පරිදි ත්‍රෛභාෂා පාසල් ලෙස සංවර්ධනය කිරිම හා නව ත්‍රෛභාෂා පාසල් 20 ක් ස්ථාපිත කිරිම යන විකල්ප යෝජනා දෙක සහිතව ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇති අතර ඒ අනුව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතව පවතී.

- මෙම වැඩසටහනට 2021 වර්ෂය සඳහා රු. මිලියන 500ක මුදලක්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් වී ඇත.
- 2022 හා 2023 වර්ෂ සඳහා අවශ්‍ය අයවැය ඇස්තමේන්තු සකස් කර ඇත.

## 2.4 දිස්ත්‍රික් මට්ටමින් අධ්‍යාපන සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ගැටළු විසඳීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු හඳුනාගැනීමේ හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම යටතේ පහත සඳහන් විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් මාලාවක් අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකත්වයෙන් දියත් කර ඇත.

- “ගම සමග පිළිසඳර“ වැඩසටහන
- සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
- “රට හදන සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අමාත්‍යාංශ කාර්ය භාරයන්ට අදාළ ඉලක්ක සපිරීමේ ප්‍රගතිය
- "ගම සමග පිළිසඳරක් තුළින් වැඩ සමග යලි ගමට - 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම" ජාතික සම්බන්ධීකරණ සමාජ යටිතල පහසුකම් අනුකමිටුව හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටු රැස්වීම්

මෙම විශේෂ කාර්යයන් හා වැඩසටහන් සඳහා පළාත් අධ්‍යාපන ආයතන හා දෙපාර්තමේන්තු ද රාජ්‍ය අමාත්‍යාංශ ද යුධ හමුදාව ද සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය කඩිනම් පියවර ගැනීමත් සියලුම පාසල්වල ගැටළු විසඳීම සඳහා කාර්යක්ෂමව කටයුතු කිරීම මෙන්ම ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පසු විපරම් කරමින් නියාමන කාර්යයන් සිදු කිරීම ද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි.

# 03. 2022 වර්ෂය සඳහා වූ ප්‍රධාන ඉලක්ක

- විමසුම් පාදක, ක්‍රියාකාරකම් කේන්ද්‍රගත මිශ්‍ර ඉගෙනුම් අවස්ථා සහිත නව විෂයමාලාවක් අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස.(උ.පෙළ) ඉලක්කගත විෂයයන් සඳහා සකස් කිරීම.
- 2022-2026 මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම සම්පාදනය.
- නව විෂයමාලාව හා සබැඳි ජාතික ශිෂ්‍ය ඇගයීම් රාමුව සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීම, ජාතික ගුරු නිපුනතා රාමුව ක්‍රියාත්මක කිරීම.
- 2021 වර්ෂයේ දී සකස් කළ ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) පිළිබඳ ප්‍රතිපත්තිය, සමස්ත අධ්‍යාපන පද්ධතියේ නියාමන හා ඇගයීම් රාමුව (M&E Framework) හා අධ්‍යාපන පර්යේෂණ පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම.
- ජාතික මට්ටමේ අධ්‍යාපන මානව සම්පත් තොරතුරු පද්ධතිය, ශිෂ්‍ය තොරතුරු පද්ධතිය සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීම.
- ජාතික පාසල් 1000ක් සංවර්ධනය කිරීම යටතේ තෝරාගත් පාසල් සහ දැනට පවත්නා ජාතික පාසල් සියල්ල සඳහා පාසල් සංවර්ධන සැලැසුම් සකස් කර අවසන් බැවින් ඒ අනුව පාසල්වලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සපයා දීම.
- අග්‍රගණ්‍ය නව ත්‍රෛභාෂා පාසල් සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම් අවසන් කිරීම හා සැලසුම්වලට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කිරීම ( නව පාසල් දෙකක් යෝජිතය) හා පවත්නා පාසල් අතුරෙන් තෝරා ගත් අනෙකුත් පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම.
- කේන්ද්‍රීය පාසල් වටා ඇති පාසල් ජාලයක් ලෙස පාසල් පද්ධතිය ව්‍යුහගත කර එම පොකුරු පාසල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදීම හා ප්‍රාථමික පාසල් ළමා මිතුරු පාසල් ලෙස සංවර්ධනය කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් අධ්‍යාපනවේදී උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණින් ජාතික ශික්ෂණවේදී ඩිප්ලෝමාව, අධ්‍යාපනවේදී උපාධි මට්ටම දක්වා උසස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා විද්‍යාපීඨ විෂයමාලාව සංශෝධනය සහ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීම.
- කාබනික පොහොර සැකසීම ව්‍යාප්ත කිරීමේ අරමුණින් කලාප මට්ටමින් තෝරාගත් පාසල් ගොවිපළ 100ක කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
- පාසල් ඇගයීම් මාර්ගෝපදේශය යාවත්කාලීන කිරීම හා විදුහල්පති අත්පොත පිළිබඳ ව දැනුම්වත් කිරීම.
- පාසල් ගුණාත්මක බව තහවුරුව සඳහා පර්යේෂණ සිදු කිරීම හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සඳහා ප්‍රමිති සැකසීම.
- 2022 වර්ෂය සඳහා නව ක්‍රීඩා පාසල් 04ක් අරම්භ කිරීමට යෝජිත අතර සමස්ත ලංකා පාසල් ක්‍රීඩා සඳහා නව ක්‍රීඩා ඉසව් ඇතුළත් කිරීමට ද සියලු පාසල් ක්‍රීඩා සංගම් නව චක්‍රලේඛයක් යටතේ ක්‍රියාත්මක කිරීමට ද යෝජිතය.
- සාමය හා සංහිඳියාවට අදාළ "යහපුරවැසිභාවය " (Good Citizenship) සංකල්පය ප්‍රවර්ධනය කිරීම උදෙසා ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් සකසන ලද අත්පොත් සම්බන්ධ වැඩසටහන් නියාමනයට නියාමන මෙවලම් (සිංහල හා දෙමළ) සැකසීම.

- අ.පො.ස. උ/පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටින විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වූ සිසුන් සඳහා NVQ 4 මට්ටම ලබාදීමට අවශ්‍ය මොඩියුල සම්පාදනය.

- ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ නිර්මාණාත්මක විද්‍යාගාර (National Resource Hubs & Innovation Labs) සැකසීම හා ඒ පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළ ඉදිරියට සිදු කිරීම.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවාගැනීම.

- 2021.12.31 දිනට පුරප්පාඩු වන ජාතික පාසල් විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීම.

- 2021.12.31 දිනට පුරප්පාඩු වන අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීම.

- නුපුහුණු ගුරුභවතුන් සියලුදෙනා පුහුණු ගුරුභවතුන් බවට පත්කිරීම, ගුරු සේවයට බඳවා ගන්නා නවක ගුරුභවතුන් සඳහා දිශානුගත පුහුණුව ලබාදීම හා ගුරු මධ්‍යස්ථාන තුළ භෞතික සම්පත් සංවර්ධනය තුළින් ගුරුභවතුන් ශක්තිමත් කිරීම.

- අධ්‍යාපන පරිපාලන සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, විදුහල්පති සේවය හා ගුරු සේවයේ පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීම හා නිලධාරීන් අදාළ ශ්‍රේණි සඳහා උසස් කිරීම ද, සේවයේ ස්ථිර කිරීම, විශ්‍රාම ගැන්වීම, කාර්යක්ෂමතා කඩ ඉම් සහන ලබාදීම හා ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීම.

- ගුරු, විදුහල්පති වැටුප් විෂමතා නිරාකරණය කිරීමට නියමිතය.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීම

- පාසල් පද්ධතිය ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල ගැන්වීම සඳහා පාසල් සඳහා පරිගණක ආශ්‍රිත උපාංග හා අන්තර්ජාල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

- යෝජිත පාසල් 1000 වැඩසටහන යටතේ ගණිත විෂයයට අදාළ ව ඉගෙනුම් චිත්‍රාගාර ස්ථාපනයට කටයුතු කිරීම.

- Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් පාසල් සිසුන්ට මඟහැරුණු ඉගෙනුම අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ගුරු ධාරිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- වාණිජ විෂය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයින්, ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයින්, පළාත් සහ කලාප මට්ටමින් අදාළ අධ්‍යාපන නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මාර්ගගත විද්වත් කතිකාවතක් සංවිධානය කිරීම තුළින් දැනුම යාවත්කාලීන කිරීම.

- සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරගාවලිය පැවැත්වීම හා සාම්ප්‍රදායික ශිල්ප ඇසුරින් ශිල්ප නවෝදා ජාතික ප්‍රදර්ශනය හා තරගය නව නිපැයුම් කොමිසම සමඟ ඒකාබද්ධ ව පැවැත්වීම.

- අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා " පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය" ( School Based Learning Improvement Grant – SBLIG ) හා "මානව සම්පත් ප්‍රවර්ධන ප්‍රදානය" ( Human Resource Improvement Grant – HRIG ) ද, ද්විතීයික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා ප්‍රදානය ද ලබාදීමට සැලසුම් කිරීම.


- ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම පිළිබඳව චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය (චක්‍රලේඛ අංක 37/2020) විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීම.

- පාසල් ආපදා කළමනාකරණ මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දීම හා ආපදා කළමනාකරණ ජාතික මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් පළාත් හා කලාප අධ්‍යාපන නිලධාරීන් සඳහා ආපදා අවම කිරීමේ පෙර සූදානම් වැඩසටහන් පැවැත්වීම.

- පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව අනුමැතියට ඉදිරිපත් කිරීම හා සකසන ලද පුස්තකාල ප්‍රමිති අනුව පාසල් පුස්තකාල ප්‍රමිති වර්ගීකරණය කිරීම.
- පුස්තකාල සුචිකරණය (Library Automation) සඳහා වැඩසටහනක් සැකසීම.
- පාසල් ඇගයීම සඳහා සකස් කර ඇති විද්‍යුත් දත්ත පාදකය ක්‍රියාත්මක කිරීම හා දුරස්ථ අධ්‍යාපනයේ ගුණාත්මක බව නියාමනයට නව ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- පරිසරයේ යහපැවැත්ම උදෙසා පරිසරය පිළිබඳ අධ්‍යයනය හා නිරීක්ෂණය (GLOBE) වැඩසටහන යටතේ පස, ජලය, වායුගෝලය හා භූමි ආවරණය පිළිබඳ අධ්‍යයනය හා සංරක්ෂණය සඳහා පාසල් 50ක ගුරුවරුන් පුහුණු කිරීම.
- සමාජ ඒකාග්‍රතාවය සඳහා මෘදු කුසලතා සහ භාෂා කුසලතා ශිෂ්‍යයන් තුළ ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අ.පො.ස. (උ/පෙළ) ජීව, රසායන, භෞතික විද්‍යා ගුරු උපදේශකවරුන්, ගුරුවරුන්, විද්‍යාගාර සහායකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ගුරු ශික්ෂණලාභීන් 8,000ක් බඳවා ගැනීම.
- ගුණාත්මක පූර්ව සේවා ගුරු අධ්‍යාපන ලබාදීම සඳහා වෘත්තීය හා කුසලතා ඇති වෘත්තීමය හා සමාජ දැනුවත්භාවය සහිත කාර්ය මණ්ඩල හා අනාගත ගුරුවරුන් සවිබල ගැන්වීම යටතේ අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම .
- කාර්යක්ෂමතා කඩ ඉම් විභාග හා සන්ධාන භාෂා පරීක්ෂණ පැවැත්වීමට අදාළ ගැසට් නිවේදන සැකසීම හා ප්‍රතිඵල නිකුත් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
- පාසල් පද්ධතියෙන් ඇඳහැලෙන සිසුන් සඳහා අනිවාර්ය අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම යටතේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා යාවජීව ඉගෙනුම් වැඩසටහන ( life long learning Programme ) ක්‍රියාත්මත කිරීම.
- නිවස පාදක කරගත් ඉගෙනුම් වැඩසටහන (Home based learning) අඛණ්ඩව පවත්වා ගෙන යාම හා දුරස්ථ ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුරුවරුන් බල ගැන්වීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ පාසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා You-tube චැනලයක් ආරම්භ කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම් බලගැන්වීම තුළින් පුද්ගල සංවර්ධනය සඳහා අත්පොතක් සකස් කිරීම.
- කලාප මට්ටමින් ක්‍රියාකාරී ශිෂ්‍ය පාර්ලිමේන්තු ඒකක 100 ක් පිහිටුවීම හා පුහුණුකරුවන් /ගුරු භවතුන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ආපදා අධි අවදානම් පාසල් හඳුනා ගෙන ආපදා කළමනාකරණ පෙර සූදානම් සැලැස්මක් සකස් කිරීම විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම.
- 2022 අ.පො.ස උසස්පෙළ විභාගයට පෙනී සිටින සිසුන් සඳහා මාර්ගෝපදේශ අත්පොත මාර්ගගතව නිකුත් කිරීම.
- "ඉගෙනුමට අරමුණක්" වැඩසටහන යටතේ පාසල් මාර්ගෝපදේශ ක්‍රියාවලිය සම්බන්ධව විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් දැනුවත් කිරීමේ එක් දින වැඩමුළු පැවැත්වීම හා ILO සහයෝගයෙන් "School to –Work" වැඩසටහන යටතේ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම.
- නව සාමාන්‍ය තත්ත්වය තුළ මතුව ඇති මානසික ගැටලු සඳහා සිසුන්ට මනෝ උපදේශනය ලබා දීම සඳහා ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් පුහුණු කිරීම.
- ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය සම්බන්ධීකරණයෙන් පළාත් මට්ටමින් උපදේශන ගුරුවරුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ පුහුණුව ලබා දීම.






සංගීත්
SANGEET
සංගීත්
SANGEET
සංගීත්
SANGEET

# 04. 2021 වර්ෂයේ ප්‍රගතිය

## 4.1 එක් එක් විෂයය ක්ෂේත්‍රය යටතේ ළඟා කර ගත් ප්‍රගතිය (2021.08.31 දිනට)

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| ♦ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය හා සහභාගිත්වය ඉහළ නැංවීම | |
| ජාතික පාසල් සංවර්ධනය සහ නව ජාතික පාසල් ඇති කිරීම | ♦ පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන (SBLEG) වැඩසටහන මගින් පාසලකට රු.මි.1ක් බැගින් පළමු අදියර යටතේ රු.මි.50ක් තෝරා ගන්නා ලද ජාතික පාසල් 50ක් සඳහා ද දෙවන අදියර යටතේ රු.මි. 127ක් තෝරා ගන්නා ලද ජාතික පාසල් 127ක් සඳහා ද ප්‍රදානය කිරීම.<br>♦ ද්විතියික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා පාසලකට රු.මි.0.1 බැගින් රු.මි.15 ක් තෝරා ගන්නා ලද ජාතික පාසල් 150 ක් සඳහා ප්‍රදානය කිරීම.<br>♦ 2021 වර්ෂය සඳහා ජාතික පාසල් සඳහා සැලසුම් කළ ලී බඩු, යන්ත්‍රෝපකරණ හා ගොඩනැගිලි අවශ්‍යතා ලබා දීමට කටයුතු කිරීම. |
| විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය සවිබල ගැන්වීම | ♦ "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම ඇතුළු සියලු ම ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම පිළිබඳව අංක. 37/2020 දරණ 2020.12.03 දිනැති චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය" පිළිබඳ පුහුණුකරුවන් 1,462ක් පුහුණු කිරීමේ වැඩසටහන් 06 පුහුණු කිරීම.<br>♦ පාසල් හැර ගිය දරුවන් අතර තාක්ෂණය ප්‍රචලිත කිරීමේ අරමුණින් හරිතාගාර 100ක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ මාර්ගගත ක්‍රමය ඔස්සේ පළාත් නොවිධිමත් අධ්‍යාපන විෂය භාර නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් 419ක් දැනුවත් කිරීම.<br>♦ පළාත් නිලධාරීන් 45ක් සඳහා නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂය සංවර්ධනය හා ප්‍රගති සමාලෝචනය අරමුණු කර ගත් වැඩසටහනක් පැවැත්වීම.<br>♦ මධ්‍යම, ඌව හා උතුරුමැද පළාත්වල නිලධාරීන් 30ක් සඳහා නොවිධිමත් විෂයය භාර කලාප මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු 02ක් පැවැත්වීම.<br>♦ නොවිධිමත් අධ්‍යාපන වෘත්තිකයන් 176ක් සහ විශේෂ අධ්‍යාපන වෘත්තිකයන් 163ක් මාර්ගගත ක්‍රමය මඟින් වැඩසටහන් 3ක් ඔස්සේ පුහුණු කිරීම.<br>♦ අන්තර්කරණ අධ්‍යාපනය තුළින් විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කිරීම (JICA) යටතේ වැඩසටහන් 2ක් මගින් නිලධාරීන් 69ක් පුහුණු කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ වෙනිවැල්කොළ ශිෂෝෂ්දා විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපන ආයතනයේ තාක්ෂණ අධ්‍යාපන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 95% ක ප්‍රගතිය ලබා ගැනීම.<br><br>♦ බුද්ධිමය ඌනතා ඇතුළු සියලු දුබලතා සහිත ළමුන් සඳහා ඉගැන්වීමට ගුරු උපදෙස් සංග්‍රහය (ID guide book) කෙටුම්පත සැකසීම හා මාර්ගගත ක්‍රමය මඟින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා ඉගැන්වීම පිළිබඳ ගුරුවරුන්ට උපදෙස් ලබා දීම. |
| වතු පාසල් සංවර්ධනය සහ දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය | ♦ ඉන්දියානු රජයේ (රු.මි. 95) සහ ශ්‍රී ලංකා රජය (දළ වශයෙන් රු.මි.15) එක්ව පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය විද්‍යාලය සංවර්ධනය කිරීම යටතේ<br>- යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. භාණ්ඩ හා උපකරණ සැපයීම සිදු කරමින් පවතී.<br><br>♦ ඉන්දියානු රජයේ ( රු.මි. 300) සහ ශ්‍රී ලංකා රජය ( රු.මි. 15) එක්ව සිදු කරන ව්‍යාපෘතියක් වන වතුකරයේ පාසල් 9 ක් සංවර්ධනය කිරීම යටතේ<br>- ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ අතර අවශ්‍ය කටයුතු සඳහා 2021 සහ 2022 දී තාක්ෂණික හා මූල්‍ය මිල ගණන් විවෘත කරන ලදී.<br><br>♦ වතු පාසල් සංවර්ධන ශාඛාව මඟින් තෝරාගත් වැවිලි පාසල්වල යටිතල පහසුකම් සංවර්ධන වැඩ සැලැස්ම කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරේ.<br><br>♦ සාමාන්‍ය පෙළ සිසුන් සඳහා කාර්ය පත්‍රිකා හා පසුගිය ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර බෙදාහැරීම හා Covid -19 වසංගතය නිසා මුස්ලිම් පාසල් තුළ සිදු වී ඇති බලපෑම අධීක්ෂණයට කටයුතු කිරීම. |
| පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ♦ අ.පො.ස.(උ/පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් සඳහා වන මාර්ගෝපදේශ අත්පොත මාර්ගගත ක්‍රමය ඔස්සේ නිකුත් කර ඇත.<br><br>♦ විදුහල්පතිවරුන් සඳහා වන වෘත්තීය මාර්ගෝපදේශන පිළිබඳ ජාතික මාර්ගෝපදේශය සම්පාදනය කිරීම.<br><br>♦ "ඉගෙනුමට අරමුණක්" වැඩසටහන යටතේ වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා නිලධාරීන් දැනුවත් කිරීම සඳහා එක් දින වැඩමුළුවක් පැවැත්වීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ ILO සමග සම්බන්ධීකරණයෙන් school to work වැඩසටහන පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 04ක් පැවැත්වීම.<br><br>♦ කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ පාසල් සිසුන්ට අවශ්‍ය මානසික සහයෝගය ලබාදීමට උපදේශන ගුරුවරුන් 42ක් පුහුණු කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම.<br><br>ශිෂ්‍ය උපදේශනය :<br><br>♦ පාසල් මට්ටමින් ගුරුවරුන් 300ක් සිසුන් 1400ක් සඳහා ශිෂ්‍ය උපදේශනය පිළිබඳ මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශන මාලාවක් පැවැත්වීම.<br><br>♦ ගුරු උපදේශකවරුන් හා උපදේශන ගුරුවරුන් සඳහා උපදේශනය සම්බන්ධව මාර්ගගත ක්‍රමය ඔස්සේ වැඩසටහන් පැවැත්වීම.<br><br>♦ කොවිඩ්-19 වසංගතය යටතේ පාසල් උපදේශන සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කරමින් පවතී. |
| 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | |
| 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | වෘත්තීය විෂය ධාරාව<br><br>♦ දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ සිසුන් වෙත වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කරමින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පාසල් සහ වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධීකරණය කිරීම.<br><br>♦ සිසුන් 4,615 වෘත්තීය පුහුණු ආයතනවල ලියාපදිංචි කිරීම<br><br>♦ සිසුන් 900 කගේ පමණ වෘත්තීය පුහුණු පාඨමාලාවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීම සම්බන්ධීකරණය කර ඇත.<br><br>♦ වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා සුදුසු නව ආයතන සම්බන්ධ කර ගැනීම.<br><br>♦ වෘත්තීය මාර්ගෝපදේශනය, ආබාධිත ළමුන් වෙත වෘත්තීය ප්‍රවේශය ලබා දීම හා පෞරුෂත්ව වර්ධනය අරමුණු කර ගනිමින් දිවයිනෙහි දිස්ත්‍රික්ක කිහිපයක පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුළින් ලබා ගත් ප්‍රතිපෝෂණයන් භාවිත කරමින් වෘත්තීය අධ්‍යාපනය දිශාභිමුඛ කිරීමේ වැඩසටහනක් නිර්මාණය කර ඇත. එහි මූලික පියවර මේ වන විට ක්‍රියාත්මක වන අතර ප්‍රවර්ධනය ද සැලසුම් කර ඇත. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ අධ්‍යාපන වැඩසටහනේ ගුරු අතිරික්ත හා ඌනතා තොරතුරු පළාත් වෙතින් ලබාගෙන ගුරු තුලනය සඳහා සැලසුම් සකස් කර ඇත. වයඹ පළාතෙහි පළාත් පාසල්වල ගුරු තුලනය අවසන් කර ඇත. ජාතික පාසල් සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත. සෙසු පළාත්වල ඊට අදාළ කටයුතු සිදුකරමින් පවතී.<br>තිරසර සංවර්ධන<br>♦ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව ජාතික මට්ටමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.<br>♦ තිරසර සංවර්ධන අරමුණු වෙත ළඟාවීමේ ශ්‍රී ලංකාවේ ප්‍රගතිය දර්ශක 11ට අදාළ ව අගයයන් ගණනය කර ශ්‍රී ලංකාවේ ප්‍රගතිය පිළිබඳ අදාළ අංශ වෙත වාර්තා කර ඇත. |
| **විද්‍යා, ගණිත. ඉංග්‍රීසි හා තාක්ෂණ අධ්‍යාපනය සංවර්ධනය** | |
| ගණිත අධ්‍යාපනය සංවර්ධනය | ♦ ලෝක බැංකු මූල්‍ය සහාය සහිත සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ 01, 02 හා 03 ශ්‍රේණි සඳහා දැලිස ඉගෙනුම් ද්‍රව්‍ය කට්ටල ද, 10 හා 11 ශ්‍රේණි සඳහා අත්‍යාවශ්‍ය ඉගෙනුම් සංකල්ප කාර්ය පත්‍රිකා සංග්‍රහය මුද්‍රණය කිරීම.<br>♦ GEMP ව්‍යාපෘතිය යටතේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි විද්‍යා ආයතනය (PGIS) හා එක්ව ගුරුවරුන්ගේ පර්යේෂණ භාවිතාවෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධන කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර තෝරාගත් පර්යේෂණ 21ක් PGIS ආයතනය මඟින් සංවිධානය කරන ලද අන්තර්ජාතික ජාතික ගණිත සහ ගණිත අධ්‍යාපන පිළිබඳ වැඩමුළු ( ICMME ) සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.<br>♦ " ගුරු ගෙදර " රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන යටතේ I වාරය සඳහා වූ සියලුම පාඩම් පටිගත කර අවසන් අතර II වන වාරය සඳහා 7 සහ 11 ශ්‍රේණියේ සියලුම පාඩම් පටිගත කර අවසන්ය.<br>♦ "e - තක්සලාව" සඳහා 6, 7, 8, 9, ශ්‍රේණි සඳහා I වාරයට අවශ්‍ය වීඩියෝ පාඩම් සකස් කර අවසන්ව ඇත.<br>♦ සබරගමුව පළාත හා එක්ව 10 සහ 11 ශ්‍රේණි සඳහා නිවාස පාදක ඉගෙනුම් වැඩසටහන් සකස් කර අවසන්ය.<br>♦ "රේඩියෝ තක්සලාව වැඩසටහන" යටතේ පළමු අදියර ලෙස ගණිත පාඩම්වල විෂය අන්තර්ගතය නිරවද්‍යතාව |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම | ♦ මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගැන්වීම් සිදුකරන විද්‍යා ගුරුභවතුන් ගේ මෘදු කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන (ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සහයෝගීත්වයෙන්) යටතේ වැඩසටහන් දෙකක් මඟින් විද්‍යා ගුරුභවතුන් 200 පුහුණු කර ඇත.<br>♦ 2021 අන්තර්ජාතික තරුණ විද්‍යාඥයා පර්යේෂණ තරගාවලියට මැලේසියාවේ පවත්වන ලද මාර්ග ගත තරඟය සඳහා නුගේගොඩ, සාන්ත ජෝසප් විද්‍යාලයේ සිසුවියක සහභාගී කර වූ අතර ඇය ජූරියේ විශේෂ සම්මානයක් ලබා ගන්නා ලදී.<br>♦ ජාතික පාසල් 40 ක් සඳහා මිලියන 8.0 වටිනකමින් යුත් රසායන ද්‍රව්‍ය ලබා දීමට කටයුතු සිදු කිරීම.<br>♦ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සහයෝගීත්වයෙන් පුංචි කෘෂිවිද්‍යාඥයා වැඩසටහන යටතේ 6,7,8 ශ්‍රේණි දරුවන් සඳහා කෘෂි පරිසරය පාදක කර ගත් විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන වැඩසටහන පැවැත්වීම.<br>♦ දුරස්ථ අධ්‍යාපන වැඩසටහන යටතේ 6-13 "ගුරුගෙදර" රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම.<br>♦ 6-11ශ්‍රේණි සඳහා ස්වයං ඉගෙනුම් කට්ටල භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කිරීම හා e - තක්සලාව වෙබ් අඩවියෙහි පළ කිරීම.<br>♦ නිවාස පාදක කරගත් අධ්‍යාපන වැඩසටහන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම.<br>♦ ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමග එක්ව කාටූන් සහ වීඩියෝ ඇසුරින් ආකර්ෂණීය ලෙස ආධාරක පාඩම් සකස් කර ඇති අතර තවදුරටත් එම කටයුත්ත සිදුකරමින් පවති.<br>♦ ඩයලොග් ආයතනය සහයෝගීත්වයෙන් අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යා ප්‍රායෝගික පරීක්ෂණ වීඩියෝ ගත කිරීම.<br>♦ අ.පො.ස. (සා/පෙළ) අඩු සාධන මට්ටම් සහිත පාසල්වල ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ පුහුණු මොඩියුලය සාදා නිමකර ඇති අතර ගුරු පුහුණුව මාර්ගගත ආකාරයට සිදු කිරීමට සැලසුම් කර ඇත. |
| ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය | ♦ ලෝක බැංකු මූල්‍ය සහාය යටතේ ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ප්‍රවර්ධන වැඩසටහන (English Language Learning Enhancement Programme) පාසල් 500ක ක්‍රියාත්මක කිරීම.<br>♦ බ්‍රිතාන්‍ය කවුන්සිලය සමග පවත්වනු ලබන මාර්ගගත පාඨමාලාව මඟින් ඉංග්‍රීසි ගුරුවරුන් 185ක් පුහුණු කර ඇත. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ GEMP - ELLE වැඩසටහන යටතේ පාසල් දීර්ඝකාලීනව වසා දැමීම නිසා සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා ඉගෙනුම අඛණ්ඩව සිදු කිරීම සඳහා 6,7,8,9,10,11 ශ්‍රේණිවල 1සහ 2වන වාරවල පාඩම් සඳහා ස්වයං අධ්‍යාපන පොත් කට්ටල සැකසීම.<br>♦ අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂා ප්‍රතිඵල සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හා 8,9,10,11 ශ්‍රේණි සඳහා ඉගෙනුම් ආධාරක කට්ටල සැකසීම.<br>♦ පෙර පාසල් සහ ප්‍රාථමික ශ්‍රේණි මූලික අවධි සඳහා ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා හඳුන්වාදීම මූලික සැලැස්ම සහ සංකල්ප පත්‍රිකාව හඳුන්වා දී ඇත.<br>♦ ගුරු ගෙදර රූපවාහිනී අධ්‍යාපනික නාලිකාව සඳහා ඉංග්‍රීසි විෂයයට අදාළ වීඩියෝ පාඩම් 124ක් සකස් කර දී ඇත.<br>♦ Us Peace Corps සංවිධානය සමග පවත්වනු ලබන මාර්ගගත පාඨමාලා මගින් ඉංග්‍රීසි ගුරුවරුන් 120ක් සහ විදුහල්පතිවරුන් 32ක් පුහුණු කර ඇත.<br>♦ RESC මධ්‍යස්ථාන ( Regional English Support Center) සඳහා නව පුහුණුකරුවන් 17ක් බඳවාගෙන ඇත.<br>♦ බ්‍රිතාන්‍ය කවුන්සිලය සමග පවත්වනු ලබන LMS ඉගෙනුම් කළමනාකරණ පද්ධති පාදක මාර්ගගත පාඨමාලාව මගින් මෙම වසර අවසානවීමට පෙර ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන් 36 දෙනෙකු සහ ඉංග්‍රීසි ගුරුවරුන් 720 දෙනෙකු පුහුණු කිරීමට නියමිතව ඇත.<br>♦ GEMP, ELLE (English Language Learning Enhancement Programme) වැඩසටහන (යටතේ මාර්ගගත දුරස්ථ අධ්‍යාපන ක්‍රම සම්බන්ධව මාර්ගගත පාඨමාලාවක් මගින් ඉංග්‍රීසි ගුරුවරුන් 1000 පමණ පිරිසක් මෙම වසර |
| තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය | ♦ OPEC මූල්‍ය සහාය සැලසෙන තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය (TEDP) යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයන්ට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන මගින් අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් ජාතික අධ්‍යාපන ආයතනයේ දී සහ පළාත් පුහුණු මධ්‍යස්ථානයන්හි දී පුහුණු කිරීමට සැලසුම් කර ඇත.<br>♦ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, නිර්මාණකරණය හා තාක්ෂණවේදය, ගෘහ ආර්ථික විද්‍යාව විෂයයන් සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටල සකස් කිරීම.<br>♦ රොබෝ තාක්ෂණ පුහුණු අත්පොත් මාලාවේ 02 වන පොත සකස් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ ඔපෙක් ආයතනය මගින් තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වන එහෙත් තාක්ෂණ පීඨ නොමැති පාසල් 36 ක නව තාක්ෂණ පීඨ 36 ක් ද තාක්ෂණ පීඨ නොමැති එහෙත් පීඨයක් ඉදි කිරිම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන හා ඉඩකඩ පහසුකම් නොමැවීම මත පවත්නා පංති කාමර තාක්ෂණගාර බවට පත් කිරීමට පාසල් 15 ක ඒ සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලින් ආරම්භ කර ඇති අතර සමහර ඒකකවල වැඩ අවසන් කර ඇත.( මෙය විදේශී ව්‍යාපෘති අරමුදල් යටතේ සිදුකරනු ලබන ඉදි කිරීම් කාර්යයක් වන අතර එම වැඩ කටයුතු තාක්ෂණ සංවර්ධන ඒකකය විසින් සම්බන්ධිකරණය කරනු ලබන අතර සියලු ක්‍රියාදාමයන් සෘජු ගෙවීම් විසින් ආධාර ඒජන්සිය විසින් සෘජුවම අදාල පාර්ශවයන් වෙත ගෙවනු ලබන වැඩ පිලිවෙලක් යටතේ ක්‍රියාත්මක වේ.)<br><br>♦ පාසල් ශිෂ්‍ය ප්‍රජාව තුළ රොබෝ තාක්ෂණය ජනප්‍රිය කිරීම සඳහා සමස්ත ලංකා රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟය මාර්ගගත ක්‍රමවේදය යටතේ මෙම වර්ෂය තුළ පැවැත්වීම.<br><br>♦ පාසල් නව නිපැයුම් සමාජ නැවත බල ගැන්වීම සඳහා කටයුතු සිදු කිරීම.<br><br>♦ තාක්ෂණවේදය විෂය ධාරාව සම්බන්ධයෙන් කරනු ලබන පර්යේෂණය පළාත් මට්ටමින් සිදු කිරීම.<br><br>♦ ගුරු ගෙදර, ඊ තක්සලාව හා නිවෙස් පාදක වැඩසටහන් වෙනුවෙන් පළමු වාරයට අදාළ අධ්‍යාපන වැඩසටහන් විකාශයට භාරදී ඇති අතර දෙවන වාරයට අදාළ අධ්‍යාපන වැඩසටහන් සකස් කරමින් පවතී.<br><br>♦ ගෘහ ආර්ථික විද්‍යා විෂය යටතේ මැහුම් විෂය සඳහා වීඩියෝ පාඩම් සකක්කර පාසල් වෙත ලබා දී ඇත.<br><br>♦ තාක්ෂණවේදය විෂයධාරාව හැදැරූ සිසුන් සඳහා නිපුණතා 4 වන මට්ටමට (NVQ 1) අදාළ සහතික ලබාදීමේ වැඩසටහන වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සමග ඇරඹීම.<br><br>♦ සිසුන්ගේ ප්‍රායෝගික තාක්ෂණ කුසලතා වර්ධනය වෙනුවෙන් අවශ්‍ය ගර්භිත වාහන ලබාදීමට කටයුතු කිරීම. |
| **සිසුන් තුළ පරිවර්තීය කුසලතා, සමාජ චිත්තවේග කුසලතා, ආචාරධර්ම හා සාරධර්ම ගොඩනැංවීම** | |
| ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනය | ♦ නිවස පාදක කරගත් ඉගෙනුම් වැඩසටහන සඳහා (Home based learning) ඉගෙනුම් උපකරණ සකස් කිරීම.<br><br>♦ Covid-19 වසංගත තත්ත්වය තුළ ප්‍රාථමික ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන සිසුන්ට අහිමි වූ ඉගෙනුම් අවස්ථා සඳහා ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට unicef ආයතනය හා පළාත් අධ්‍යාපන නිලධාරීන් අතර සම්බන්ධීකරණය. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
| --- | --- |
| | ♦ “e තක්සලාව“ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සඳහා ඉගෙනුම් අන්තර්ගත සකස් කිරීම.<br>♦ ගුරු ගෙදර “රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන සඳහා 1 හා 2 ශ්‍රේණිවලට අදාළ ව I වාරය සඳහා පාඩම් පටිගත කර අවසන් කිරීම හා 3, 4, හා 5ශ්‍රේණි සඳහා I හා III වාරවලට අදාළ පාඩම් පටිගත කර අවසන් කිරීම.<br>♦ Covid 19 වසංගත තත්වය නිසා ප්‍රාථමික ශ්‍රේණිවල අධ්‍යාපන ලබන සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට සිදුවී ඇති බලපෑම විමසා බැලීම සඳහා ක්‍රියාත්මක පර්යේෂණයට අදාළ පර්යේෂණ උපකරණ සකස් කිරීම සඳහා සහාය වීම.<br>♦ ජාතික පාසල් 177 ක ප්‍රාථමික අංශ සඳහා ගුණාත්මක යෙදවුම් සඳහා මුදල් ලබාදීම.<br>♦ ජාතික පාසල් 8ක ප්‍රාථමික අංශයේ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට සහ ජාතික පාසල් 5 ක ප්‍රාථමික අංශයේ නව ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ අවශ්‍යතා ලේඛන පාසල් ගොඩනැගිලි ශාඛාවට ලබාදීම.<br>♦ ජාතික පාසල් 49ක ප්‍රාථමික අංශ සඳහා මධ්‍යම ප්‍රමාණයේ ළමා ඩෙස් හා පුටු ලබාදීම. |
| ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය සංවර්ධනය කිරීම | ♦ නුවණ හා කූර්මති සඟරා දෙක මුද්‍රණය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.<br>♦ රූපවාහිණි ගුරු ගෙදර, ඊ තක්සලාව, ඉ.ගුවන් විදුලිය, නිවෙස් පාදක ඉගෙනුම් වැඩසටහන් වෙනුවෙන් පාඩම් සකස් කිරීම.<br>♦ නව ප්‍රතිසංස්කරණ යටතේ යෝජිත විෂය නිර්දේශ ප්‍රතිංස්කරණලවලට අදාළ ව විෂය කරුණු සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය සමඟ කටයුතු කිරීම. |
| ද්වි භාෂා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම | ♦ ප්‍රමුඛ ධාරිතා වැඩසටහන ලෙස තෝරාගත් ගුරුවරුන් කණ්ඩායම් දෙකක් සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (ද්විභාෂා අධ්‍යාපනය) හැදෑරීම සඳහා අනුග්‍රහය ලබා දීම හා මාර්ගගත ක්‍රමය ඔස්සේ ධාරිතා සංවර්ධන ක්‍රියාකාරකම් හා ප්‍රායෝගික ගුරු පුහුණුව සිදු කිරීම.<br>♦ ගුණාත්මක සංවර්ධනය යටතේ පහත සඳහන් වැඩසටහන් 3 ඉලක්ක කර ගනිමින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් රාමු සැකසීම.<br>    ♦ Content Language Integrated Learning (CLIL) වැඩසටහන (විෂය හා භාෂා සමෝධානික ඉගෙනුම) යටතේ මඟපෙන්වන්නන් (Navigators) බලාත්මක කිරීමේ වැඩසටහන. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ Subject based English Language Improvement Programme (SELI) ද්විභාෂා ප්‍රවේශයකින් සේවා සපයන ගුරුභවතුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා සංවර්ධනය සඳහා සුසාධ්‍යකරුවන් (Mentors) බලාත්මක කිරීමේ වැඩසටහන.<br>♦ ICT based 21st Century Core Skills Enhancement Programme ද්විමාධ්‍ය ප්‍රවේශයෙන් සේවා සපයන ගුරුභවතුන් සඳහා තොරතුරු තාක්ෂණය පාදක කර ගත් 21 වන සියවසේ මෘදු කුසලතා සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාකරුවන් (Operators) බලාත්මක කිරීමේ වැඩසටහන. |
| සාම අධ්‍යාපනය හා සමාජ සංහිඳියාව | ♦ සාමය හා සංහිඳියාවට අදාළ "යහපුරවැසිභාවය" සංකල්පය ප්‍රවර්ධනය කිරීම උදෙසා ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් සකස් කරන ලද අත්පොත හා ගුරු පුහුණුව සම්බන්ධ පුහුණු මෙවලම් ඇතුළත් වීඩියෝ පට හයක් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් සකස් කිරීම.<br>♦ එම අත්පොත් සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් වයඹ හා දකුණු පළාත්වල පවත්වන ලද අතර මුද්‍රණය කරන ලද අත්පොත් වයඹ, ඌව, නැගෙනහිර හා දකුණු පළාත්වල බෙදා හැරීම. |
| කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සංවර්ධනය | ♦ අ.පො.ස. (උ/පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය හා කෘෂි විද්‍යාව විෂය සඳහා ස්වයං ඉගෙනුම් කට්ටල 24ක් ද, ජෛව පද්ධති තාක්ෂණවේදය ආදර්ශ ප්‍රශ්න පත්‍ර 01ක් ද, කෘෂි විද්‍යාව විෂය සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර 01 ක් ද, අ.පො.ස. (සා/පෙළ) කෘෂි හා ආහාර තාක්ෂණවේදය විෂයය සඳහා ස්වයං ඉගෙනුම් කට්ටල 12ක් ද සකස් කිරීම.<br>♦ 'ගුරු ගෙදර' රූපවාහිනී වැඩසටහන යටතේ අ.පො.ස. (උ/පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය හා කෘෂි විද්‍යාව විෂය සඳහා වැඩසටහන් සංස්කරණය හා සම්බන්ධීකරණය කිරීම.<br>♦ ඊ - තක්සලාව සඳහා අන්තර්ගත පාඩම් සකස් කිරීම හා නිවෙස් පාදක ඉගෙනුම් යටතේ අ.පො.ස.(සා/පෙළ) කෘෂි හා ආහාර තාක්ෂණවේදය සඳහා සකස් කළ ඉගෙනුම් උපකාරක පත්‍රිකා සංස්කරණය කිරීම.<br>♦ අ.පො.ස.(උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්වැල සකස් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය | ♦ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වාණිජ විෂය ධාරාවේ නාම සංශෝධනයට අවශ්‍ය කටයුතු කිරීම.<br>♦ පාසල් තුළ ව්‍යවසායකත්ව සංගම් පිහිටුවීම සම්බන්ධයෙන් SLIM ආයතනය සමඟ සියලුම පළාත්වල විෂය අධ්‍යක්ෂවරු සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් ද ගුරුවරුන් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් ද පැවැත්වීම.<br>♦ අ.පො.ස (සා/පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය සහ ව්‍යවසායකත්ව අධ්‍යයනය සඳහා ද අ.පො.ස (උ/පෙළ) ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව විෂයයන් සඳහා පුනරීක්ෂණ ප්‍රශ්න බැංකුවක් භාෂාත්‍රයෙන් සකස් කිරීමේ කටයුතු 75% ක් පමණ සම්පූර්ණ කර ඇත.<br>♦ දුරස්ථ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම යටතේ e තක්සලාවට අන්තර්ගතයන් පරීක්ෂා කිරීම හා නිවස පාදක කරගත් අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>♦ ගුරුගෙදර රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උ.පෙළ) ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය යන විෂයයන්වල පටිගත කිරීම් අවසන් කර ඇති අතර අ.පො.ස. (සා.පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණය, ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂයයන්වල පාඩම් පටිගත කෙරෙමින් පවතී.<br>♦ අ.පො.ස (සා/පෙළ) සඳහා 3 වන වාරයටත් අ.පො.ස (උ/පෙළ) සඳහා 1 වන වාරයටත් ස්වයං ඉගෙනුම් කට්ටල සකස් කිරීම.<br>♦ ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහන් වෘත්තිය ආයතන සමඟ පටිගත කිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇත. |
| පාසල් පුස්තකාල සංවර්ධනය | ♦ ගුරු පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ කෙටුම්පත සකස් කිරීම.<br>♦ පුස්තකාල ප්‍රමිති කෙටුම්පත සකස් කිරීම.<br>♦ පුස්තකාල සඳහා උපදෙස් සංග්‍රයේ කෙටුම්පත සකස් කිරීම.<br>♦ පාසල් පුස්තකාල සම්බන්ධ දත්ත ගොනුවට සියලුම පළාත්වලින් ලැබෙන තොරතුරු ඇතුළත් කිරීම. |
| විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සංවර්ධනය | ♦ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විෂය සමගාමී විෂයමාලාව පාසල් විෂයමාලාව තුළ අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්කිරිමට අදාළ සැලසුම් සකස් කර ඇති අතර, ඒ අනුව සතියකට පැය 1 බැගින් වසරකට අනිවාර් පැය 30ක් තුළ සිසුන් යෙදිය යුතු විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ යෝජනා ද ජාතික අධ්‍යාපන ආයතනය වෙත ඉදිරිපත් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ ශිෂ්‍යනායකයින් බඳවාගැනීම සඳහා වන ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය දෙමළ භාෂාවෙන් සකස් කිරීම.<br>♦ නව සාමාන්‍යකරණය යටතේ විෂය සමගාමී විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් සඳහා වැඩසටහන් දියත් කළ යුතු ආකාරය පිළිබඳ මූලික සාකච්ඡාවක් පවත්වා ඇති අතර, වැඩසටහන් මොඩියුල සකස් කිරීමට පියවර ගැනීම.<br>♦ පවත්නා වසංගත තත්ත්වයන් යටතේ පාසල් මට්ටමින් වැඩසටහන් දියත් කිරීම සම්බන්ධව ජාතික ශිෂ්‍යභට බලකාය, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය හා ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය සමඟ මූලික සාකච්ඡාවක් පවත්වා මූලික උපදෙස් ලබා දීම. |
| පාසල් ආපදා කළමනාකරණ හා ශිෂ්‍ය පාර්ලිමේන්තුව | ♦ ශිෂ්‍ය පාර්ලිමේන්තු නව චක්‍රලේඛය පිළිබඳ ව පළාත් හා කලාප සම්බන්ධීකරණ නිලධාරීන් හා සැලසුම් අධ්‍යක්ෂවරුන් 56 ක් දැනුවත් කිරීම සඳහා වන වැඩසටහනක් ජාතික මැතිවරණ කොමිෂන් සභාවේ සහයෝගය ද සහිතව පැවැත්වීම.<br>♦ මාර්ගගත ක්‍රමය ඔස්සේ ශිෂ්‍ය පාර්ලිමේන්තු ප්‍රගති සමාලෝචන වැඩසටහන පැවැත්වීම.<br>♦ පාසල් පාදක කළමණාකරණ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම. |
| ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය | ♦ නවක පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා කැළණිය විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් ශාරීරික අධ්‍යාපය පිළිබඳ ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාවන් ආරම්භ කර ඇති අතර ජාතික අධ්‍යාපන ආයතනය, සබරගමුව විශ්වවිද්‍යාලය , යාපනය විශ්වවිද්‍යාලය හා ජාතික ක්‍රීඩා විද්‍යායතය මඟින් ද ඩිප්ලෝමා පාඨමාලාවන් ආරම්භ කිරීමට නියමිතය.<br>♦ මාර්ගගත වැඩසටහන් හා සාකච්ඡා මඟින් ක්‍රීඩා පාසල්වල විදුහල්පතිවරුන්ගේ ගුණාත්මක සංවර්ධන ප්‍රවේශයන් සිදු කිරීම හා සිසුන්ගේ අභිප්‍රේරණය හා මානසික සංවර්ධනය සඳහා කටයුතු කිරීම.<br>♦ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රීඩා හා ජාතික පාසල් සියල්ල සඳහා ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම, අධ්‍යාපන කලාපයකට එක් ක්‍රීඩා පිටියක් බැගින් ක්‍රීඩා පිටි සියයක් සංවර්ධනය කිරීම සහ ක්‍රීඩා පාසල් 16ක් සංවර්ධනය කිරීම.<br>♦ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව නව ක්‍රීඩා පාසල් 2ක් සංවර්ධනය සඳහා කටයුතු කිරීම.<br>♦ පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා දැනුම සංවර්ධන වැඩසටහන් පාසල් ක්‍රීඩා සංගම් සමග එක්ව මාර්ගගත වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීම. ( මලල ක්‍රීඩා, මේස පන්දු , කබඩි, චෙස්, ජූඩෝ, එල්ලේ ) |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| සෞන්දර්යය අධ්‍යාපනය | ♦ චිත්‍ර, නර්තන, පෙරදිග සංගිත හා නාට්‍ය කලා යන විෂයයන්ට අදාළ ව 6-13 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් සැකසීම, වීඩියෝ පාඩම් පටිගත කිරීම හා සංස්කරණය කිරීම.<br>♦ සෞන්දර්ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වීඩියෝ තාක්ෂණය භාවිතයට ගුරුවරුන් පුහුණු කිරීම.<br>♦ සෞන්දර්ය විෂයන් සඳහා වීඩියෝ පාඩම් සැකසීමේ පෙර පුහුණු වැඩසටහන පැවැත්වීම.<br>♦ සංගීත් ශාස්ත්‍රීය සගරාව (4 වන කලාපය) පිටපත් 7,000 ක් මුද්‍රණය කර බෙදා හැරීම.<br>♦ මාර්ගස්ථ ඉගෙනුම් ආධාරක (video Lesson) සකස් කිරීම සඳහා ගුරුවරු පුහුණු කිරීමේ වැඩමුළුව යටතේ පළාත් මට්ටමින් විෂයානුබද්ධව ශිල්පිය ගුරු භවතුන් 554ක් පුහුණු කිරීම.<br>♦ ජාත්‍යන්තර මාතෘ භාෂා දින සැමරුම් වැඩසටහන පැවැත්වීම.<br>♦ දුරස්ථ අධ්‍යාපනය මගින් සෞන්දර්ය විෂයයීය පාඩම් ඉගැන්වීම් කටයුතු සිදු කිරිම. |
| ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය | |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල තත්වය ඉහළ නැංවීම | ♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ගුරු ශික්ෂණලාභීන් 4253 දෙනෙකු බඳවා ගැනීම.<br>♦ ගුණාත්මක පූර්ව සේවා ගුරු අධ්‍යාපනය ලබා දීම සඳහා වෘත්තීය කුසලතා ඇති වෘත්තීමය හා සමාජ දැනුවත්භාවය සහිත කාර්ය මණ්ඩලයක් සහ අනාගත ගුරුවරුන් සවිබල ගැන්වීම යටතේ අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් සඳහා වෘත්තීමය සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>♦ තෝරාගත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වෙත සුහුරු පංති කාමර සඳහා අවශ්‍ය, ප්‍රාථමික ආදර්ශ පංති කාමර සඳහා අවශ්‍ය උපාංග, ඩිජිටල් පුස්තකාල සඳහා අවශ්‍ය උපාංග, ඉංග්‍රීසි ක්‍රියාකාරකම් කාමර සඳහා අවශ්‍ය සහ Smart Interactive Panels බෙදා හැරීමට කටයුතු කිරීම.<br>♦ තාක්ෂණික ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදි කිරීම සඳහා කටයුතු කිරීම. |
| පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD) | ♦ පාසල් තුළ පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය බෙදාහැරීම හා එය නියාමනය සඳහා පිරික්සුම් ලයිස්තුවක් සැකසීම.<br>♦ ගුරු මධ්‍යස්ථාන 112 මගින් ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා මොඩියුල සකස් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
| --- | --- |
| | ♦ ගුරු විද්‍යාලවලට අවුරුදු දෙකක පුහුණු පාඨමාලාව සඳහා උපාධිධාරී නොවන ගුරුවරුන් 973 දෙනෙකු බඳවා ගැනීම.<br>♦ ගුරු මධ්‍යස්ථානවල භෞතික සම්පත් සංවර්ධනයට කටයුතු සැපයීම. |
| ජාතික ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය සහ ගුරු කළමනාකරණය | ♦ ජාතික ගුරු නිපුණතා රාමුව සකස් කර ඉදිරි කටයුතු සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා ප්‍රධාන කොමසාරිස් (ගුරු සංවර්ධන) වෙත ඉදිරිපත් කිරීම.<br>♦ පාසල් මට්ටමේ අධ්‍යාපන කාර්ය මණ්ඩලය 6/2021 චක්‍රලේඛයට අනුකූලව ගණනය කිරීම සහ ඒ සම්බන්ධ ජාතික පාසල් සහ පළාත් සම්බන්ධීකාරකවරු පුහුණු කිරීම. |
| පාසල් නගා සිටුවීමේ වැඩසටහන හරහා පාසල් බල ගැන්වීම. | |
| පාසල් නගා සිටුවීමේ වැඩසටහන සවිබල ගැන්වීම. | ♦ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශයට අනුව පාසල් පවත්වාගෙන යාමට අදාළ මාර්ගෝපදේශ පාසල් වෙත ලබාදීම.<br>♦ දරුවන් සඳහා ගමනාගමන පහසුකම් සැපයීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.<br>♦ පාසල් නගාසිටුවීමේ හා බලගැන්වීමේ වැඩසටහන ශක්තිමත් කිරීම හා ඒ හා සබැඳි මනෝ සමාජීය කුසලතා සංවර්ධනයට පාසල් වෙත අවශ්‍ය ක්‍රියාකාරකම් හා උපදෙස් ලබාදීම.<br>♦ ගුරුභවතුන් සඳහා Covid -19 ට එරෙහි එන්නත් මාත්‍රා ලබාදීමට අදාළ පියවර ගැනීම.<br>♦ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට අදාළ ව දරුවන් සඳහා පාසල් මගින් අයදුම් කිරීමට මාර්ගගත ක්‍රමයක් සැකසීම සහ එමගින් අභියාචනා හා ශිෂ්‍යත්වලාභීන් තේරීමට කටයුතු කිරීම. |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය | |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය | ♦ පාසල් පරිගණක විද්‍යාගාරවල පරිගණක දෘඩාංග හා මෘදුකාංග නඩත්තු කාර්යයන් සඳහා කලාප මට්ටමින් ස්ථාපිත කර ඇති පරිගණක හා ජාලකරණ විසඳුම් කණ්ඩායමේ ගුරුභවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් ගුරුභවතුන් හතළිස් දෙදෙනකු සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 3ක් පැවැත්වීම.<br>♦ 2021 වර්ෂය සඳහා උතුරු මැද පළාතේ පාසල්වල පරිගණක නඩත්තු වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය හා උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඒකාබද්ධ ව සිදු කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
| --- | --- |
| | ♦ අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මගින් නිර්මාණය කරන ලද නිදහස් හා විවෘත මෘදුකාංගයක් වන ‘ඉසුරු ලිනක්ස්’ මෘදුකාංගයේ නව සංස්කරණයක් සකස් කර එය පාසල් පද්ධතියට හඳුන්වා දීම සඳහා අත්පොතක් සකස් කිරීම සඳහා වැඩමුලු පැවැත්වීම.<br>♦ අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය එක්ව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට අදාළව ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.<br>• ‘ගුරු ගෙදර’ අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන<br>• ‘නිවෙස පාදක ඉගෙනුම් වැඩසටහන’ හා 10-11ශ්‍රේණිවලට අදාළ ව මොඩියුල සකස් කිරීම.<br>• ඉ-තක්සලාව ඉගෙනුම් අන්තර්ගත පද්ධතිය<br>♦ මාර්ගගත/දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය මූලික උපදෙස් හා මග පෙන්වීම් ඇතුළත් මර්ගෝපදේශ සංග්‍රහයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ අන්තර්ගත කිරීම.<br>♦ අන්තර්ජාල/මාර්ගගත අධ්‍යාපන ක්‍රියාවලිය සමඟ සම්බන්ධවීමට නොහැකි දරුවන් උදෙසා කලාප මට්ටමින් ප්‍රාදේශීය ඉගෙනුම් මධ්‍යස්ථාන 3000 ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.<br>♦ ටැබ් පරිගණක ව්‍යාපෘතියට අදාළව ටැබ් පරිගණක ප්‍රශස්ථ මට්ටමින් භාවිත කිරීම සඳහා උපදෙස් සංග්‍රහයක් සකස් කර සිංහල / දෙමළ පිටපත් 5,000 ක් පාසල් වෙත ලබා දීම.<br>♦ ටැබ් පරිගණක ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපති ඇතුළු කථිකාචාර්යවරුන් පුහුණු කිරීම.<br>♦ පාසල් සඳහා වෙබ් අඩවි නිර්මාණයට අවශ්‍ය පුහුණුව ලබාදී 2021 වර්ෂය තුළ පාසල් 350ක පමණ වෙබ් අඩවි නිර්මාණය කර ස්ථාපිත කිරීම.<br>♦ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ලෝක බැංකු සහනදායී ණය ආධාර යටතේ පාසල් පද්ධතිය ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල ගැන්වීම සඳහා පහත ව්‍යාපෘති ආරම්භ කිරීම.<br>• ග්‍රාමීය පාසල් 100ක් සඳහා පරිගණක හා ආශ්‍රිත උපාංග ලබා දීම.<br>• ජාතික පාසල් හා ජාතික පාසල් ලෙස සංවර්ධනය වීමට නියමිත පාසල් 25ක් සඳහා සුහුරු පන්ති කාමර උපාංග ලබා දීම හා පාසල් 35ක් සඳහා පරිගණක හා ආශ්‍රිත උපාංග ලබා දීම.<br>• පාසල් 705ක අභ්‍යන්තර ජාලය ස්ථාපිත කිරීම, අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම හා අන්තර්ජාල බිල්පත් ගෙවීම සඳහා අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | |
| පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම. | ♦ පාසල් පද්ධතියට නිකුත් කිරීම සඳහා 2017-2019 පාසල් විශිෂ්ට ව්‍යවහාර ඇතුළත් ප්‍රකාශනය සහ පාසල් ඇගයීම් පිළිබඳ විද්‍යුත් දත්ත පාදකය සකස් කරමින් පවතී.<br>♦ පාසල් ඇගයීම් පිළිබඳ විද්‍යුත් දත්ත පාදකය සකස් කර ඇති අතර පාසල් ආරම්භ වීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීමට හැකි වේ.<br>♦ අධ්‍යාපනයේ ගුණාත්මක තත්වය පිළිබඳ අධ්‍යාපන නිලධාරින් විසින් සිදු කරන ලද පර්යේෂණ 11ක් ඇතුළත් කර සකස් කළ පර්යේෂණ ප්‍රකාශනය මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇත.<br>♦ 2020 පාසල් ගුණාත්මක තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව සකස් කර මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇති අතර 2021 වාර්තාව සකස් කිරීම සඳහා සැලසුම් කරමින් පවතී.<br>♦ විදුහල්පති අත්පොත සකස් කර වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර පාසල්වලට බෙදා දීම සඳහා මුද්‍රණයට ඉදිරිපත් කර ඇත. |
| **සාක්ෂි පදනම් කර ගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය,පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම.** | |
| සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම. | ♦ 2022 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම කෙටුම්පත් කිරීම.<br>♦ ලෝක බැංකු සහනදායී ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (GEM Project) අධ්‍යාපන අමාත්‍යාංශය හා අදාළ ජාතික මට්ටමේ අධ්‍යාපන ආයතනවල 2021 වර්ෂයේ සැලසුම් හා පළාත්වල ව්‍යාපෘති සැලසුම් සඳහා සහාය ලබා දී ලෝක බැංකු එකඟතාවය ලබා ගැනීමට කටයුතු කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.<br>♦ 2020 සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ තුන්වන පාර්ශ්වීය ඇගයීම සම්බන්ධීකරණය.<br>♦ කොළඹ විශ්ව විද්‍යාලයේ NEREC ආයතනය සමඟ එක් වී 8 ශ්‍රේණියේ ශිෂ්‍ය ප්‍රාප්ති මට්ටම් ඇගයීම නිමකර ඇති අතර 4 ශ්‍රේණියේ ශිෂ්‍ය ප්‍රාප්ති මට්ටම් ඇගයීමේ තක්සේරුකරණය වැඩසටහනේ මූලික කටයුතු ආරම්භ කිරීම.<br>♦ ජාතික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ තෝරාගන්නා ලද පාසල් සඳහා පාසල් පාදක සැලසුම්කරණ සම්බන්ධයෙන් මාර්ගෝපදේශය චක්‍රලේඛයක් නිකුත් කිරීම හා එම පාසල් 831හි විදුහල්පතිවරුන්, සියලුම පළාත් හා කලාපවල නියෝජ්‍ය හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පාසල් පාදක සැලසුම්කරණය සම්බන්ධයෙන් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පුහුණු කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ ජාතික පාසල් 1,000 ට අදාළ අවසන් පාසල් ලැයිස්තු සකස් කර ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා එම ලේඛණ අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීම.<br>♦ මෙම වැඩසටහනට තෝරා ගන්නා ලද පාසල්වල සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් 2021-2023 දක්වා සැලසුම් ගත අයවැය යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.<br>♦ මෙම වැඩසටහනට තෝරාගන්නා ලද පාසල්වල සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා මධ්‍යකාලීන සැලැස්මක් කෙටුම්පත් කර ඇති අතර පාසල්-පාදක අවශ්‍යතා ද ඇතුළත් කරමින් තවදුරටත් වැඩිදියුණු කරන ලද සමස්ත යෝජනාවලියක් මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.<br>♦ තෝරාගෙන ඇති ජාතික පාසල් 831 ක සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදානයක් ලබා දීම.<br>♦ පාසල් සඳහා වූ නව ජාතික ප්‍රතිමාන හා නිර්ණායක හඳුන්වා දීම.<br>♦ දිස්ත්‍රික්ක මට්ටමින් ත්‍රෛභාෂා ද්විතීයික පාසල් සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන පළාත් බලධාරීන් වෙත උපදෙස් සංග්‍රහයක් නිකුත් කර ඇති අතර ඒ ජාතික පාසල් 1,000 සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පොකුරු පාසල් / පාසල් ජාල සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘති යෝජනාවක් කෙටුම්පත් කර ඇත.<br>♦ 2020 අය වැය මඟින් යෝජනා වී ඇති රුපියල් මිලියන 3,000 ට යටත්ව ව්‍යාපෘති යෝජනා සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.<br>♦ තුර්කිය හා ශ්‍රී ලංකාව අතර අධ්‍යාපනය සම්බන්ධව අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශවවලින් නිරීක්ෂණ හා අදහස් ලබා ගැනීම.<br>♦ ඉන්දියානු ආධාර යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 200ක සුහුරු පන්ති කාමර ඇති කිරීම සම්බන්ධව අවබෝධතා ගිවිසුම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් අදාළ අනුමැතීන් ලබා ගැනීම සහ අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම.<br>♦ ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ද්විතියික අධ්‍යාපන ආංශීය සංවර්ධන වැඩසටහනෙහි (SESIP) අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ COVID-19 හදිසි තත්වයට මුහුණ දීම සඳහා සකස් කළ සැලැස්මට (Contingency Emergency Response Component –CERC Plan) අදාලව ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, මුදල් ප්‍රතිපාදන ගෙන්වා ගැනීමට කටයුතු කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.<br><br>♦ CERC සැලැස්මට අනුව පාසල් පාදකව සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් ඇති කිරීම හා ප්‍රතිකාර්යය කඩිනම් ප්‍රදානයක් ලබාදීම. ඒ සඳහා අදාල චක්‍රලේඛ සකස් කිරීම හා රජයේ සියලුම පාසල් සඳහා පාසල් පාදක ප්‍රදානයන් ලබාදීම.<br><br>♦ UNICEF ආධාර ලබාදෙන ඌව/මධ්‍යම/නැගෙනහිර/ උතුර පළාත්වලට අමතරව, අනෙකුත් සියලු ම පළාත් සඳහා ද COVID-19 වසංගතය යටතේ ආධාර ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා රුපියල් මිලියන 2 බැගින් ප්‍රතිපාදන ලබාදීම.<br><br>♦ පාසල් ව්‍යුහ කටයුතු සඳහා ඉදිරිපත් වී ඇති සියලුම ඉල්ලීම් පිළිබඳව සලකා බලා අවශ්‍ය තීරණ ලබා දී ඇත. මෙහි දී සමාන්තර පන්ති වැඩි කිරීම, නව පන්ති ආරම්භ කිරීම, කිලිනොච්චි හා තණමල්විල නව අධ්‍යාපන කලාප පිහිටුවීම හා නව ක්‍රීඩා පාසල් ආරම්භ කිරීම ඒ අතරින් ප්‍රධාන වේ |
| **පාසල්,කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම** | |
| අධ්‍යාපන පද්ධතිය නියාමනය හා ඇගයීම | ♦ වාර්ෂික කාර්යසාධන වාර්ථාව හා පාර්ලිමේන්තු අයවැය කාරකසභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම.<br><br>♦ සමස්ත අධ්‍යාපන පද්ධතිය නියාමනය හා ඇගයීම් රාමුවක් සකස් කිරීම.<br><br>♦ ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය, මිලියන 1000 ට වැඩි ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය මාසිකව හා කාර්තුමය වශයෙන් ව්‍යාපෘති කළමණාකරන දෙපාර්තමේන්තුව වෙත හා අදාළ අංශ වෙත වාර්ථා කිරීම.<br><br>♦ ගම සමග පිළිසඳර වැඩසටහන, සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුවට අදාළ ප්‍රගතිය, සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යයභාර්ය ඉටු කිරීමේ ප්‍රගතිය, "ගම සමග පිළිසඳරක් තුළින් වැඩ සමග යලි ගමට - 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම" ජාතික සම්බන්ධීකරණ අනුකමිටුව හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටු ප්‍රගතිය ජනාධිපති කාර්යාලයට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ අදාළ අංශ වෙත වාර්තා කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| තොරතුරු පද්ධතීන් යාවත්කාලීන කිරීම හා කාර්යමණ්ඩල අවශ්‍යතා නිර්ණය කිරීම | ♦ අධ්‍යාපන වෘත්තිකයන්ගේ දත්ත පද්ධතිය, ජාතික ශිෂ්‍ය තොරතුරු පද්ධතිය, භූගෝලීය තොරතුරු පද්ධතිය හා වෙනත් මාර්ගගත තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම හා පුහුණු කිරීම.<br>♦ පාසල් සංගණන දත්ත අනුව වාර්තා ප්‍රකාශයට පත්කිරීම, අවසන් දත්ත පරිශීලකයන් වෙත දත්ත ලබාදීම (පාසල් සංගණන දත්ත හා වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගන්නා දත්ත මත පදනම්ව)<br>♦ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සිසුන් සඳහා අදාල කඩඉම් ලකුණු ලබාදීමේ ක්‍රියාවලියට තාක්ෂණික සහාය ලබාදීම.<br>♦ විද්‍යාපීඨ සඳහා සිසුන් තෝරාගැනීමට අදාළ ව තාක්ෂණික සහාය ලබාදීම.<br>♦ ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ දරුවන් 1 ශ්‍රේණියට ඇතුළත්වීමේ දී පාසල් තේරීමට තාක්ෂණික සහාය ලබාදීම.<br>♦ මාර්ගගත පද්ධතිවල තිරසර සංවර්ධනය සඳහා සම්පත් ලබාදීම.<br>♦ ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්බන්ධ ප්‍රතිපත්තිය සැකසීම හා කළමනාකරණය.<br>♦ පවත්නා අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට අදාළ ව හඳුනාගැනීමේ අධ්‍යයනයක් ක්‍රියාත්මක කිරීම. |
| අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය | ♦ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය කේන්ද්‍ර කර ගනිමින් සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයන 03ක් සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දීම.<br>♦ අධ්‍යාපන පර්යේෂණ පිළිබඳ මාර්ගෝපදේශයක් කෙටුම්පත් කිරීම.<br>♦ ශ්‍රී ලංකාවේ සෑම පාසලකම ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රශස්ත මට්ටමේ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කිරීමේ යාන්ත්‍රණයක් හඳුනාගැනීම සඳහා වන පර්යේෂණ අධ්‍යයනයක් සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පාසල්වල ක්‍රියාත්මක වූ දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් සිදුකර ගෙන යාම. |
| මානව සම්පත් සංවර්ධනය | ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II / III ශ්‍රේණිවල නිලධාරීන් 223 දෙනෙකු සඳහා මාර්ගගත ක්‍රම ඔස්සේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.<br>♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා හදාරණ විදේශීය පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් පරිපාලන හා පාඨමාලා ගාස්තු ගෙවීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|

- ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යාපනික තක්සේරුව හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2021 -2022) සඳහා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 17ක් සහභාගී කරවීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන සංවිධානය කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයේ නියුතු කාර්යාල කාර්ය සහායකයින් සඳහා වූ වෘත්තීය සංවර්ධනය වැඩසටහන පැවැත්වීම වෙනුවෙන් ගෙවීම් කිරීම.
- මූලික විදුහල්පතිවරු වැඩසටහනේ (BPP) විදුහල්පතිවරුන්ගේ පැවරුම්පත් පරීක්ෂාව.
- ගුරු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා ක්‍රියාත්මක කෙරෙන මොඩියුල වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබා දීම.

## ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය

අධ්‍යාපන සේවාවන්හි තනතුරු පුරප්පාඩු පිරවීම

| සේවාව | බඳවා ගැනීම | උසස් කිරීම් |
|---|---|---|
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | - | I - 35<br>II - 135 |
| ශ්‍රී ලංකා විදුහල්පති සේවය | - | I - 326<br>II - 387 |
| ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | 24 | I - 05<br>II - 30 |
| ශ්‍රී ලංකා ගුරු සේවය<br>2016-2018 ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්<br>උපදේශන ගුරුවරුන් | <br>3730<br>750 | - |

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට 10 දෙනෙකු උසස් කිරීම.
- ජාතික පාසල් විදුහල්පති තනතුරු 166ක් සඳහා ශ්‍රේණිධාරී විදුහල්පතිවරු පත් කිරීම.
- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථිර කිරීම් 820ක් සිදු කිරීම.
- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 1 පන්තියට 636ක් සහ 2 පන්තියට 422ක් ලෙස උසස්වීම් සිදු කිරීම.

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|

- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල පැවති පීඨාධිපති, උප පීඨාධිපති හා ගුරු විද්‍යාලවල විදුහල්පති යන තනතුරු පුරප්පාඩු **84**කින් සුදුසුකම් ලද නිලධාරීන් ගණන අනුව පුරප්පාඩු **53**ක් සම්පූර්ණ කිරීම.

- ජාතික පාසල් විදුහල්පති පුරප්පාඩු යටතේ **2020.12.31** දිනට පැවති පුරප්පඩු **170**න් **105** සම්මුඛ පරීක්ෂණය මගින් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට නිලධාරීන් බඳවා ගැනීම යටතේ.
  - 2016 වර්ෂයෙන් පසුව **2017,2018,2019** හා **2020** වර්ෂවල අධ්‍යාපන පරිපාලන සේවයේ සීමිත / විවෘත හා කුසලතා පදනම මත බඳවා ගැනීමට අදාල විභාග පවත්වා නොමැති බැවින් සේවයේ නිලධාරීන් හිඟයක් ඇති වී ඇත.
  - 2021.06.04 දිනැතිව සීමිත හා කුසලතා පදනම මත පිළිවෙලින් පුරප්පාඩු **442**ක් හා **67**ක් සම්පූර්ණ කිරීම සඳහා ගැසට් නිවේදනය නිකුත් කර ඇත.
  - 2021.07.16 දිනැතිව විවෘත පදනම මත පුරප්පාඩු **113**ක් සම්පූර්ණ කිරීම සඳහා ගැසට් නිවේදනය නිකුත් කර ඇත.

- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම යටතේ.
  - ශ්‍රී ලං.ගු.අ.සේ. අනුමත කාර්යය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු **1090**ක් සම්පූර්ණ කිරීම සඳහා අදාළ ආයතන වලින් අනුමැතිය ලබා ගත් අතර ගැසට් නිවේදනය **2020.02.07** දින ප්‍රසිද්ධ කර නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන ලදි. ඒ අනුව විවෘත විභාගය මේ වන විට පවත්වා අවසන් අතර රට තුළ පවතින කොවිඩ්-**19** වසංගත තත්ත්වය මත සීමිත විභාගය පැවැත්වීමට නොහැකි විය. කෙසේ වුවද **2022** වර්ෂය තුළ බඳවා ගැනීමේ කාර්යය අවසන් කිරීමට අපේක්ෂිතය.

- ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ ස්ථාපිත කිරීම.
  - දැනට සේවයේ නියුතු ගුරු උපදේශකවරු ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මනාපය පල කළ ගුරු උපදේශකවරුන්ගේ පුද්ගලික ලිපිගොනු අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.
  - ගුරු උපදේශක සේවය සඳහා නව බඳවා ගැනීම් සඳහා සියලු පළාත් වෙතින් පුරප්පාඩු කැඳවා

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ ශ්‍රී ලංකා ගුරු සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම යටතේ.<br>• 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ ගුරු පත්වීම් ලබා දීම සඳහා 2018 වර්ෂයේ දී පැවැත්වූ තරග විභාගයේ ප්‍රතිඵල මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීමට අපේක්ෂිතය. ඊට අමතරව උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමට නැවත ගැසට් නිවේදනයක් පල කිරීමට ද කටයුතු කරමින් පවතී.<br>♦ ගුරු විදුහල්පති වැටුප් විෂමතාවය නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, අමාත්‍ය මණ්ඩල අනුකමිටුව මගින් යෝජිත පරිදි 2018 වාර්තාවේ ඇතුළත් වැටුප් යෝජනා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.<br>♦ පවත්නා ගුරු සේවා ව්‍යවස්ථාවේ දෝෂ හඳුනා ගැනීම සහ ඒ සඳහා සේවා ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කිරීම හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු සේවාවන් ඒකාබද්ධ කොට සංවෘත සේවාවක් බවට පත් කිරීමට නියමිත බැවින් එම කාර්යය හා සමගාමීව සිදු කිරීමට අපේක්ෂිතය.<br>♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළව ප්‍රතිඵල නිකුත් කර ඇති අතර පලමු වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය 2021.01.01 දිනැති ගැසට් නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇත. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන සන්ධාන භාෂා පරීක්ෂණයට අදාල ගැසට් නිවේදනය ද 2021.01.01 දිනැතිව පල කර ඇත. |

# 05. විදේශාධාර යටතේ ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘති

## 5.1 තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : ඇමරිකානු ඩොලර් මිලියන 60.7

ව්‍යාපෘති කාල සීමාව : 2018 - 2023

ආධාර ලබාදෙන ආයතනය : ජාත්‍යන්තර සංවර්ධනය සඳහා OPEC ආධාර (OFID)

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- තාක්ෂණික විද්‍යාගාර 36 ක් අලුතින් ඉදි කිරීම.
- පවතින තාක්ෂණික විද්‍යාගාර 15ක අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කිරීම.
- පාසල් 380 ක තාක්ෂණික විද්‍යාගාර පහසුකම් නඩත්තු කිරීම.
- පාසල් 51 ක් සඳහා යන්ත්‍ර, උපකරණ හා ගෘහ භාණ්ඩ ලබාදීම.
- 13 වසරක අනිවාර්ය අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් 286 ක යන්ත්‍ර හා උපකරණ වැඩි දියුණු කිරීම.
- තාක්ෂණ ගුරුවරුන්ගේ හා අදාළ විෂයය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.
- ගුරුවරුන් සඳහා අධ්‍යාපන උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා අවස්ථා ලබා දීම.
- ගුරු පුහුණුව සඳහා ජාතික අධ්‍යාපන ආයතනයට තාක්ෂණ උපකරණ හා ගෘහ භාණ්ඩ ලබාදීම.

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :

- තාක්ෂණික විද්‍යාගාර 36ක් ඉදි කිරීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකර ටෙන්ඩර් ලබා දී ඉන් 24ක ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත.
- පවතින තාක්ෂණික විද්‍යාගාර 5ක අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කිරීම සඳහා ටෙන්ඩර් ලබා දී ඇති අතර තවත් විද්‍යාගාර 10ක් සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී.
- වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කරනු ලබන පාසල් 286කට උපකරණ හා යන්ත්‍ර ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදුකර ඇත.
- ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය යටතේ අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකර සිංහල හා ඉංග්‍රීසි පුහුණු මාර්ගෝපදේශ හා අවශ්‍ය ඉගැන්වීම් උපාංග සකස් කිරීම හා වැඩසටහන් සැලසුම් කිරීම සිදුකරමින් පවතී.
- තාක්ෂණ ගුරුවරුන් සඳහා අධ්‍යාපන උපාධිය (B.Ed) ලබා දීමේ වැඩ කටයුතු ආරම්භ කර ඇත.
- ජාතික අධ්‍යාපන ආයතනය සඳහා භාණ්ඩ හා උපකරණ ලබාදීම යටතේ අනුමත භාණ්ඩ වලින් කොටසක් ලබා දී ඇති අතර ඉතිරිය සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදු කර ඇත.

**2021.08.31 වියදම : රුපියල් මිලියන 146.33**

**2022 වර්ෂයට නියමිත වැඩකටයුතු :**

- තාක්ෂණික විද්‍යාගාර 36 ක් ඉදි කිරීම් කටයුතු, තාක්ෂණික විද්‍යාගාර 15ක අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් කටයුතු හා පාසල් 380 ක තාක්ෂණික විද්‍යාගාර පහසුකම් නඩත්තු කිරීම් ඉදිරියට කරගෙන යාම.

- පාසල් 286ක යන්ත්‍ර හා උපකරණ වැඩි දියුණු කිරීම හා ජාතික අධ්‍යාපන ආයතනය සඳහා භාණ්ඩ හා උපකරණ ලබාදීමේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම.
- ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය හා තාක්ෂණ ගුරුවරුන් සඳහා අධ්‍යාපන උපාධිය (B.Ed) ලබා දීමේ වැඩ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කිරීම.

## 5.2 සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ( GEMP)

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : ඇමෙරිකානු ඩොලර් මිලියන 100

ව්‍යාපෘති කාල සීමාව : 2019 – 2023

ආධාර ලබාදෙන ආයතනය : ලෝක බැංකුව

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- ඉංග්‍රීසි විෂයෙහි ඉගෙනුම් ඵල වැඩි දියුණු කිරීම.
- ගණිත විෂයට අදාළ ඉගෙනුම් ඵල වැඩි දියුණු කිරීම.
- පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් රජයේ සියලු පාසල්වල ක්‍රියාත්මක කිරීම.
- පාසල් නඟාසිටුවීම බලගැන්වීමේ වැඩසටහන සියලු රජයේ පාසල්වල ක්‍රියාත්මක කිරීම.
- ගණිත සහ ඉංග්‍රීසි විෂයන් සඳහා ඩිජිටල් ඉගෙනුම් මූලාශ්‍ර ප්‍රවර්ධනය.
- ප්‍රමිති සහ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා පාසල් ප්‍රජාව පාදක කරගත් පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීම.
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයින් සහ ගුරු අධ්‍යාපනඥයින් සඳහා පශ්චාත් උපාධි පාඨමාලා ලබාදීම.
- අන්තර්කරණ අධ්‍යාපනය, පුරවැසි අධ්‍යාපනය හා සමාජ ඒකාබද්ධතාවය, වෘත්තීය මාර්ගෝපදේශනය සවිබල ගැන්වීම.
- පාසල් සෞඛ්‍ය හා යහපැවැත්ම නඟා සිටුවීම.

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :

- ඉංග්‍රීසි විෂයෙහි ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන (English Language Learning Enhancement – ELLE programme) පාසල් පළාත් 09 ම ආවරණය වන පරිදි පාසල් 500ක ක්‍රියාත්මක කිරීම, මාර්ගෝපදේශයන් සහ උපදෙස් මාලාවන් සකස් කර පාසල් වෙත බෙදා හැරීම, පළාත් සහ කලාප මට්ටමින් අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු සහ ගුරුවරු පුහුණු කිරීම.
- ගණිත විෂයට අදාළ ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන [Mathematics Learning Enhancement (MLE) programme] පළාත් 09 ම ආවරණය වන පරිදි පාසල් 500 ක ක්‍රියාත්මක කිරීම, පළාත් සහ කලාප මට්ටමින් අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු සහ ගුරුවරු පුහුණු කිරීම, මාර්ගෝපදේශ, ගුරුවරු සහ සිසුන් සඳහා අවශ්‍ය උපදෙස් සංග්‍රහ පාසල් සඳහා බෙදා හැරීම.

- පාසල් මට්ටමින් සමීක්ෂණයක් සිදුකර පාසල් පාදක වෘත්තීය ගුරු පුහුණු අවශ්‍යතා හඳුනා තෝරා ගත් කලාප 45% ක නිලධාරීන් හා විදුහල්පතිවරු දැනුම්වත් කිරීම.

- පාසල් නඟාසිටුවීම බලගැන්වීමේ වැඩසටහන [Enhanced Programme for School Improvement (EPSI)] සම්බන්ධයෙන් සකසන ලද මාර්ගෝපදේශ සියලු පාසල් වෙත බෙදා හැරීම.

- අත්‍යවශ්‍ය විෂය ඒකක සඳහා ඉගෙනුම් ආධාරක සකස් කර ඊ- තක්සලාව වෙබ් අඩවියට බාගත කිරීමට කටයුතු කර ඇත.

- ඩිජිටල් ඉගෙනුම් ආධාරක සකස් කිරීම පිළිබඳ ව නිලධාරීන් සඳහා දින තුනක පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- පාසල් අධ්‍යාපන ප්‍රමිති සහ ගුණාත්මක බව කළමනාකරණය සඳහා වූ ජාතික වැඩසටහන සම්බන්ධයෙන් අධ්‍යාපන නිලධාරීන් හා විදුහල්පතිවරු දැනුම්වත් කර, අභ්‍යන්තර හා බාහිර ඇගයීම් පාසල් 2,000 ක ක්‍රියාත්මක කිරීම.

- අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයින් සහ ගුරු අධ්‍යාපනඥයින් 101 දෙනෙකු තෝරාගෙන ඔවුන්ට විශ්ව විද්‍යාල තෝරා ගෙන දන්වන ලෙස උපදෙස් ලබා දී දැනට නිලධාරීන් 05 දෙනෙකු මාර්ගගත ක්‍රමවේදය යටතේ විදේශීය පශ්චාත් උපාධි පාඨමාලා හදාරණු ලබන අතර තවත් 17 දෙනෙකු විශ්ව විද්‍යාල සඳහා තේරී පත්වී ඇති අතර ඔවුන්ට ඒ සඳහා ඇතුළත් වීමේ කටයුතු මේ වනවිට සූදානම් කරමින් පවතී.

- අධ්‍යාපන කලාප 45% ක ප්‍රමාණයක් යහපුරවැසි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**2021 වර්ෂය තුළ ඉටුකරන ලද සුවිශේෂී කාර්යයන් :**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා COVID – 19 හදිසි ප්‍රතිචාර සැලැස්ම (Contingency Emergency Response Component) සකස් කර ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- COVID-19 වසංගත තත්ත්වය මත සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් යටතේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම සැලැස්ම ක්‍රියාත්මක කෙරේ.

- සැලැස්මේ සමස්ත ඇස්තමේන්තුගත මුදල (2021/2022) -ඇ.ඩො. මිලියන 20.02 (ආසන්න වශයෙන් රු.මි. 3,800.00)

- මෙම සැලැස්ම සඳහා ප්‍රතිපාදන සැලැසෙනුයේ ලෝක බැංකු ණය ආධාර යටතේ සංචිත මූල්‍ය ප්‍රතිපාදන හරහා ය.

- මෙම සැලැස්ම ක්‍රියාත්මක වනුයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයට ප්‍රතිපාදන ලැබුනේ 2021 ජූනි මස සිට ය.

මෙම සැලැස්ම යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන්

1) පාසල් මට්ටමේ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද ප්‍රවර්ධනය

   - පානීය ජල පහසුකම් නොමැති පාසල් 267 ක් සඳහා 2021 වර්ෂයේ ජල පහසුකම් සැපයීම.

   - ජාතික ප්‍රතිමාන අනුව සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවන පාසල් 881 ක් සඳහා එම පහසුකම් සැපයිම.

2) ඩිජිටල් සම්මිශ්‍රණ ඉගෙනුම් ප්‍රවර්ධනය (Blended Learning)

   - රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ජාතික අධ්‍යාපනය මඟින් ක්‍රියාත්මක වේ)

- අන්තර්ජාල පහසුකම් නොමැති පාසල් 651 ක් සඳහා එම පහසුකම් ලබාදීම.
- පරිගණක පහසුකම් ඌන පළාත් පාසල් 100ක් සඳහා එම උපකරණ හා උපාංග සැපයීම, පාසල් 35ක් සඳහා පරිගණක (All in one computers) සැපයීම, සුහුරු පන්තිකාමර 25ක් සඳහා උපකරණ ලබාදීම.
- ඩිජිටල් ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීම.

3) COVID -19 වසංගත තත්ත්වය නිසා සිසුන්ට අහිමි වූ ඉගෙනුම් /අධ්‍යයන කාලය සම්බන්ධයෙන් ඉගෙනුම් කඩිනම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාසල් මට්ටමින් සෞඛ්‍යාරක්ෂිත වැඩසටහන් ප්‍රවර්ධනය.

**2021.08.31 දිනට වියදම - රුපියල් මිලියන 1316.89**

**2022 වර්ෂයට නියමිත වැඩකටයුතු :**

- ඉංග්‍රීසි විෂයෙහි ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීමේ වැඩසටහන (ELLE) පාසල් 500 ක ක්‍රියාත්මක කිරීම මගින් සිසුන් 60%ක ඉංග්‍රීසි විෂයෙහි ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම
- ගණිත විෂයෙහි ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීමේ වැඩසටහන (MLE) පාසල් 500 ක ක්‍රියාත්මක කිරීම මගින් සිසුන් 60%ක ගණිත විෂයෙහි ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම
- අධ්‍යාපන කලාප 60% ක ප්‍රමාණයක් පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධනය වැඩසටහනට අදාළ ඉලක්ක කරා ළඟා කරවීම.
- අධ්‍යාපන කලාප 60% ක ප්‍රමාණයක් පාසල් බල ගැන්වීමේ වැඩසටහනට (EPSI) අදාළ ඉලක්ක කරා ළඟා කරවීම.
- පාසල් ප්‍රජාව පාදක කරගත් පාසල් ගුණාත්මක බව තහවුරු කිරීමේ වැඩසටහන් තවදුරටත් පාසල් අවම වශයෙන් 2,500 ක ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, ගුරු අධ්‍යාපනඥයින්, විෂයමාලා සංවර්ධිතයින්ගෙන් තෝරාගත් 65 දෙනෙකුට විදේශ විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවස්ථාව ලබා දීම.
- අධ්‍යාපන කලාප 60% ක ප්‍රමාණයක් යහපුරවැසි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පාසල් 750ක සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සියලුම විෂයය ඒකක සඳහා ඩිජිටල් ඉගෙනුම් ආධාරක සකස් කිරීම සහ ඊ - තක්සලාවට උඩුගත කිරීම.
- ගණිත සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සුහුරු ඉගෙනුම් ආධාරක සකස් කිරීම පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

## 5.3 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : ඇමෙරිකානු ඩොලර් මිලියන 7.5

ව්‍යාපෘති කාල සීමාව : 2018-2022

ආධාර ලබාදෙන ආයතනය : කොයිකා (KOICA)

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 13ක නව ඉදිකිරීම් හා පහසුකම් වැඩි දියුණු කිරීම.
- තෝරාගත් පාසල් සඳහා ගෘහභාණ්ඩ උපකරණ හා තත්වයෙන් උසස් ඉගෙනුම් ආධාරක ලබාදීම.
- වඩාත් අන්තර්කරණය වූ හා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ගුරුවරුන්ගේ හා ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධනය සිදුකිරිම.
- ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා මනෝ සමාජීය යහපැවැත්ම, ධනාත්මක සංවර්ධනය, වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා වැඩසටහන් සිදු කිරීම.
- අධ්‍යාපන නිලධාරීන් සඳහා පළාත් හා කලාප මට්ටමේ අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියලුම විශේෂ අධ්‍යාපන ගුරුවරු හා ගුරු උපදේශකවරු සඳහා දැනුම හා හැකියාව ප්‍රවර්ධනයට පුහුණු වැඩමුළු පැවැත්වීම.

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :

- ♦ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 13ක් අලුත්වැඩියා කිරීම හා පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ අලුත්වැඩියා කිරීම් 25% ක පමණ හා නව ඉදිකිරීම් 83% පමණ නිම කිරීම.
- ♦ තෝරාගත් පාසල් 13 සඳහා ගෘහ භාණ්ඩ හා ඉගෙනුම් උපකරණ ලබාදීම යටතේ මේස, පුටු, ක්‍රීඩා භාණ්ඩ, තාක්ෂණික උපකරණ හා වාදන භාණ්ඩ ලබා දීම.
- ♦ පාසල් 13 සඳහා තත්වයෙන් උසස් ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක ලබාදීමේ පළමු හා දෙවන අදියර අවසන් කිරීම.
- ♦ වඩාත් අන්තර්කරණය වූ හා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ගුරුවරුන් සඳහා හඳුන්වා දීම හා ධාරිතා සංවර්ධනය කිරීම, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියලුම විශේෂ අධ්‍යාපන ගුරුවරු සඳහා දැනුම හා හැකියාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම හා සමාජ සංහිඳියාව හා මනෝ සමාජීය යහපැවැත්ම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් සිදුකිරීම යන කොටස් 60% පමණ නිම කිරීම.

**2021.08.31** දිනට වියදම - ඇමෙරිකානු ඩොලර් මිලියන **4.90**

**2022** වර්ෂයට නියමිත වැඩ කටයුතු :

- ♦ සැලසුම් කර ඇති වැඩසටහන්වල ඉදිරි කටයුතු සිදුකිරීම.

## 5.4 ද්විතීයික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ( ICT Hubs) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : රුපියල් මිලියන 4281

ව්‍යාපෘති කාල සීමාව : 2019 - 2021

ආධාර ලබාදෙන ආයතනය : Korean Exim Bank/EDCF

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- ජාතික විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණ මධ්‍යස්ථානය හෝමාගම ඉදිකිරීම.
- දකුණු හා නැගෙනහිර පළාත්වල ප්‍රාදේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම
- ජාතික විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණ මධ්‍යස්ථානය හා ප්‍රාදේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබා දීම.
- අදාළ නිලධාරීන් සඳහා දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දීම.

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :

- ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා මූලික සැලසුම් කාර්යයන් සිදු කිරීම.
- ශක්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම.
- ජාතික විෂයානුබද්ධ මෘදුකාංග නිර්මාණ මධ්‍යස්ථානය සඳහා ස්ථානයක් තෝරා ගැනීම.
- ණය සඳහා අත්සන් තැබීම හා උපදේශන සේවාවක් හඳුනා ගැනීම.
- මූලික ප්‍රසම්පාදන වැඩ කටයුතු සිදු කිරීම.

## 5.5 පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය විද්‍යාලය සංවර්ධනය කිරීම

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : රුපියල් මිලියන 109.25

ව්‍යාපෘති කාල සීමාව : 2019-2021

ආධාර ලබාදෙන ආයතනය : ඉන්දියානු ජනරජය

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය විද්‍යාලයේ විද්‍යාගාර, පන්ති කාමර සහ පරිපාලන ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම
- පාසලට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම

2021 වර්ෂය තුළ ලබා ඇති ප්‍රගතිය:

- යටිතල පහසුකම් සංවර්ධන අංගය සම්පූර්ණ කර ඇත.
- පාසල් භාණ්ඩ හා උපකරණ සැපයුම් අංගය සැකසෙමින් පවතී.

2021.08.31 වියදම : රුපියල් මිලියන 76.84

## 5.6 යුනෙස්කෝ ආධාර ලබන වැඩසටහන් - ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය ( වාර්ෂික) : 2021 සඳහා රුපියල් මිලියන 10

වයාපෘති කාල සීමාව : වාර්ෂිකව

ආධාර ලබාදෙන ආයතනය : UNESCO

අපේක්ෂිත අරමුණු :

- ජාතික තිරසාර සංවර්ධනය අත් කර ගැනීම සඳහා අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, ජන සන්නිවේදනය, සමාජ විද්‍යාව සහ පරිසරය යන ක්ෂේත්‍රවලට අදාළ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම පිණිස එක් එක් අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවෙන් හා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.
- සාමය සහ තිරසාර සංවර්ධනය සහතික කිරීම සඳහා රජය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ කටයුතු කිරීම.
- නව සංකල්ප දියත් කිරීමට ප්‍රථමයෙන් දේශීය පාසල් පද්ධතිය තුළ එබඳු සංකල්ප කොතෙක් දුරට සාර්ථකද යන්න පරීක්ෂා කර බැලීම වෙනුවෙන් නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- දේශීය සංවර්ධනය තුළ දේශීය උරුමයන්ට හා නව්‍යතාවන්ට ජාත්‍යන්තර කීර්තිය ආරක්ෂාව ලබා ගැනීම වෙනුවෙන් ක්‍රියා කිරීම.
- යුනෙස්කෝව හා සබැඳි ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ජාතික සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා පුහුණු වැඩමුළු මෙහෙයවීමට ක්‍රියා කිරීම.
- අපගේ රටට ගැලපෙන යුනෙස්කෝ ගෝලීය සංකල්ප හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.

2021 වර්ෂය තුළ ලබා ඇති ප්‍රගතිය :

- enikki festa චිත්‍ර තරගාවලිය අවසන් කර ඇති අතර ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග බෙදා දීම සිදු කරමින් පවතී.
- කොවිඩ් වසංගත කාලය තුළ දරුවන්ගේ මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම සඳහා වූ වැඩසටහන්වලට දායකත්වය සපයන ලදී.
- සහකම්පනය පිළිබඳ ඉගෙනීම සම්බන්ධයෙන් ගුරු උපදේශකවරු දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

2020.08.31 දිනට වියදම - රුපියල් මිලියන 1.43

## 5.7 යුනිසෙෆ් හා අධ්‍යාපන අමාත්‍යාංශය අතර සහයෝගිතා වැඩසටහන

ඇස්තමේන්තු ගත ආයෝජනය (2021 වර්ෂය සඳහා) : රුපියල් මිලියන 16

ව්‍යාපෘති කාල සීමාව : 2018-2022

ආධාර ලබාදෙන ආයතනය : යුනිසෙෆ්

**2021 වර්ෂය සඳහා ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :**

- ජාතික අධ්‍යාපන ආයතනය මගින් සිදුකරන සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන හා සෞන්දර්යය අධ්‍යාපනයට අදාළ වැඩසටහන් සඳහා මූල්‍ය හා තාක්ෂණ සහාය ලබා දීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සමාජ සංහිඳියාව ඒකකය මගින් සිදු කරන සමාජ සංහිඳියාව හා සාම අධ්‍යාපනය සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්තයක් සකස් කිරීමට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණ සහාය ලබා දීම.

**2021 වර්ෂය තුළ ලබා ඇති ප්‍රගතිය:**

රට තුළ පවතින වසංගත තත්වය හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදුකරන වැඩසටහන් ආරම්භකර නොමැති අතර ජාතික අධ්‍යාපන ආයතනය මගින් සිදුකරන වැඩ කටයුතු ද අගෝස්තු මස සිට ආරම්භ කර ඇත.

- පාසල් ළමුන්ට අඛණ්ඩ අධ්‍යාපන අවස්ථා සැපයීම: 1 සහ 2 වසරවල ළමුන් සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කරමින් පවතී.
- සෞන්දර්ය අධ්‍යාපනය සඳහා අතිරේක මොඩියුල සකස් කිරීම සඳහා ගුරුවරු හා ගුරු උපදේශකවරු 100ක ගේ ධාරිතා සංවර්ධනය සිදු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- සමාජ ඒකාබද්ධතාවය හා සාමය ගොඩනැංවීම සඳහා සාමූහික ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරමින් පවතී.

**2021.08.31 දිනට වියදම - රුපියල් මිලියන 0.00**

**2022 වර්ෂයට නියමිත වැඩකටයුතු :**

- අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමය හා සංහිඳියාව ඒකකයේ මේ වසරේ කිරීමට නියමිත වැඩ කටයුතු රට තුළ පවතින වසංගත තත්වය හේතුවෙන් ලබන වසර තුළ ක්‍රියාත්මක කිරීමට UNICEF ආයතනය එකග වී ඇත.

## 5.8 තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම හා ගුරු පුහුණු ක්‍රමවේදයක් ගොඩනැගීම

**ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය: රුපියල් මිලියන 2080**

**ව්‍යාපෘති කාල සීමාව : 2015-2022**

**ආධාර ලබාදෙන ආයතනය : කොයිකා (KOICA)**

**අපේක්ෂිත අරමුණු :**

- **තාක්ෂණ ගුරුවරුන් සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම.**
- **තාක්ෂණ ගුරුවරුන් සඳහා නව ගුරු පුහුණු ක්‍රමවේදයක් ගොඩනැගීම.**

**ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :**

- තාක්ෂණික ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදි කිරීම සඳහා නාරංගල්ල, කුලියාපිටිය අදාළ ඉඩමෙහි 2020-08-31 වන දින මුල්ගල තබා ඇත.
- මෙම විද්‍යාපීඨය ඉදිකිරීමේ ස්ථානය වෙනස් කිරීම පිළිබඳ පසුව යෝජනාවක් ඉදිරිපත් වූ වැවින් ඒ පිළිබඳ සාකච්ඡා කර තීරණය කිරීමට අවශ්‍ය වූ නිසා මෙහි ඉදි කිරීම් කටයුතු යම් කිසි ප්‍රමාදයකට ලක් වූ අතර පසුව එම ස්ථානයම සුදුසු බවට අවසාන තීරණය වූ බැවින් එහි කටයුතු නැවත ආරම්භ කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා KOICA ආයතයනය කටයුතු කරමින් පවතී.
- KOICA ආයතයනයේ යෝජනාවක් මත උද්ගත වී ඇති COVID වසංගතය හමුවේ ඉදි කිරීම් කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් ඉදිකිරීම් ප්‍රවේශය ව්‍යාපෘති පාදක ප්‍රවේශයට (Project Based Approach) මාරු කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව සාකච්ඡා ගිවිසුම ( Road of Discussion) සංශෝධනය කර මෙම ව්‍යාපෘතියෙහි වගකිව යුතු පාර්ශව තුන වන අධ්‍යාපන අමාත්‍යංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා KOICA නියෝජිතයන් විසින් අත්සන් කිරීමට නියමිතය.

**2021.08.31 වියදම : රුපියල් මිලියන 16.63**

**2022 වර්ෂයට නියමිත වැඩකටයුතු :**

ඉහත සඳහන් කළ වැඩසටහන් වල ඉදිරි වැඩකටයුතු 2022 වර්ෂය සඳහා සැලසුම් කර ඇත.

## 5.9 පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ත්‍රෛභාෂා පාසලක් ආරම්භ කිරීම

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : රුපියල් මිලියන 1200

ව්‍යාපෘති කාල සීමාව : 2017 - 2022

ආධාර ලබාදෙන ආයතනය : ඉන්දියානු ජනරජය / ශ්‍රී ලංකා ජනරජය

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ත්‍රෛභාෂා පාසලක් ආරම්භ කිරීම.

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :

- ව්‍යාපෘතියේ පළමු අදියර ඉන්දියානු ජනරජයේ මිලියන 300ක ආධාර යටතේ ක්‍රියාත්මක වේ.
- පළමු අදියරේ කටයුතුවලින් 41%ක් පමණ 38%ක මූල්‍ය ප්‍රගතියක් සහිතව මුල් සැපයීම්කරුවන් විසින් නිමවී ඇත.
- ඉතිරි කොටස සඳහා නව සැපයුම්කරුවකු තෝරාගෙන ඇති අතර එහි වැඩ කටයුතු ආරම්භ කරමින් පවතී.
- දෙවන අදියරේ වැඩ කටයුතුවලින් 38%ක් පමණ 39.8%ක මූල්‍ය ප්‍රගතියක් සහිතව නිමවී ඇත. ඉතිරි වැඩ කටයුතු ඉදිරියට කරගෙන යමින් පවතී.

2021.08.31 වියදම : රු. මි. 194.84

2022 වර්ෂයට නියමිත වැඩකටයුතු :

දෙවන අදියර ඉතිරි වැඩ කටයුතු සහ තුන්වන අදියර වැඩ කටයුතු 2022 වර්ෂයට සැලසුම් කර ඇත.

## 5.10 වතුකර ප්‍රදේශවල පාසල් නගාසිටුවීම

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : රුපියල් මිලියන 345

ව්‍යාපෘති කාල සීමාව : 2019-2021

ආධාර ලබාදෙන ආයතනය : ඉන්දියානු ජනරජය / ශ්‍රී ලංකා ජනරජය

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- ඌව, මධ්‍යම, සබරගමුව හා දකුණු පළාත්වල වතු පාසල් නවයක් නගාසිටුවීම.

2021 වර්ෂය තුළ ලබා ඇති ප්‍රගතිය:

- ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ අතර අවශ්‍ය කටයුතු සඳහා තාක්ෂණික හා මූල්‍ය මිල ගණන් විවෘත කිරීම් සිදුකරමින් පවතී.

2022 වර්ෂයට නියමිත වැඩකටයුතු :

- තාක්ෂණික හා මූල්‍ය මිල ගණන් විවෘත කිරීම් සිදුකිරීම
- තෝරාගත් වතු පාසල් නවයෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

2021.08.31 වියදම : රුපියල් මිලියන 4.89

## 5.11 ද්විතීයික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP) (2021 සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත)

ඇස්තමේන්තු ගත සමස්ත ආයෝජනය : ඇමෙරිකානු ඩොලර් මිලියන 400

ව්‍යාපෘති කාල සීමාව : 2021-2025

ආධාර ලබාදෙන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව

ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු :

- පුළුල් ජාතික විෂයමාලා ප්‍රතිසංස්කරණයක් සිදු කිරීම.
- නව විෂයමාලා ක්‍රියාත්මක කිරීමට අවැසි නව්‍ය ගුරු පුහුණුව.
- ඒ හා සමගාමී නව්‍ය වූ ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලියක් හඳුන්වා දීම.
- පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ අධ්‍යාපන නිළධාරීන්/ බලධාරීන් හා විදුහල්පති පුහුණුව හා සූදානම් කරවීම.
- ගුරු තුලනය හා ගුරු සැපයීම සහතික කිරීම.
- අ.පො.ස. (සා.පෙළ) ගණිතය හා විද්‍යා විෂය සහ අ.පො.ස. (උ.පෙළ) විද්‍යා, ගණිත, තාක්ෂණ, වාණිජ විෂය ධාරා සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීම.
- නිර්ණායක මූලිකව 1AB වර්ගයේ ජාතික පාසල් 148 ක් හා පළාත් පාසල් 600 ක් තෝරාගෙන ඉලක්ක සත්‍යාපනය කිරීම.
- 2024 වසරේ දී නව විෂයමාලාව හා ඇගයීම් ක්‍රමවේදයට අනුව අ.පො.ස. (සා.පෙළ) විභාගය පැවැත්වීම.
- අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) ප්‍රතිපත්තිය, නියාමනය හා ඇගයීම් රාමුව සැකසීම.
- අධ්‍යාපන පර්යේෂණ පිළිබඳ විස්තරාත්මතක මාර්ගෝපදේශයක් සැකසීම.

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය :

- "සෞභාග්‍යයේ දැක්ම" අධ්‍යාපන හා මානව ප්‍රාගධන සංවර්ධන ඉලක්ක හා බැඳුණු නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රමුඛතාව ලැබෙන අයුරින් ආසියානු සංවර්ධන බැංකු (ADB) ආධාර මත ක්‍රියාත්මක SESIP වැඩසටහන ආරම්භ කර ඇත.

| | ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය : |
|---|---|
| DLI 1 | ♦ නව විෂයමාලාව අනුව ජාතික ශිෂ්‍ය ඇගයීම් රාමුවක් නිර්මාණය කිරීමට අදාලව ජාතික හා පාසල් මට්ටමෙන් ඇගයීම් අන්තර්ගතය හා ප්‍රමිතීන් හඳුනාගැනීම, ඇගයීම් ප්‍රතිපත්ති රාමුවට අදාළ මූලික අන්තර්ගතය ගොනු කිරීම ආදිය සිදු කිරීම.<br>♦ නව ජාතික ශිෂ්‍ය ඇගයීම් රාමුව (NSAF) පිළිබද පුහුණුව සඳහා විභාග දෙපාර්තමේන්තුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කණ්ඩායම් හඳුනාගනිමින් පුහුණුව ආරම්භ කිරීමට කටයුතු සකස් කරමින් පවතී. |

| | වයාපෘතියේ සමස්ත ප්‍රගතිය : |
|---|---|
| DLI 2 | ♦ අ.පො.ස. සා/පෙළ හා උසස් පෙළ තෝරාගත් විෂයයන් සඳහා විචාරාත්මක සම්මිශ්‍රිත ඉගෙනුම් විෂයමාලා සංවර්ධනය සිදුකිරීමේ කටයුතු සඳහා විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනයට සම්බන්ධ නිලධාරීන් ඇතුළත් කමිටුවක් පත්කර ඇති අතර ප්‍රාථමික ශ්‍රේණි සිට 11 ශ්‍රේණි දක්වා විෂය නිර්දේශ හා ඉගෙනුම් උපකරණ සූදානම් කරමින් පවතී.<br>♦ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධව සංවේදී වූ මාධ්‍ය වැඩසටහන් සඳහා ජනතා දැනුවත්කිරීම් සිදුකර ජන මතය විමසීම හා ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය හා එක්ව මේ සඳහා සැලසුම් සකස් කිරීම සිදුකරනු ලබයි. |
| DLI 3 | ♦ ගුරු පුහුණුව සඳහා වන ජාතික ව්‍යවහාර සම්පත් දායකත්ව කේන්ද්‍රය පිහිටුවීම සඳහා ඒකාබද්ධ කමිටුවක් මගින් අවශ්‍ය ප්‍රමිති හඳුනා ගැනීම, ඒ සඳහා ස්ථාන හඳුනාගැනීම, අවශ්‍යවන උපකරණ සැපයීම, කාර්ය මණ්ඩල අවශ්‍යතා සැපයීම ආදියද, ගුරු නිපුණතා රාමුවට අනුව 6- 11 ගුරු පුහුණු සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම සිදුකිරිම. |
| DLI 4 | ♦ පළාත්, ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව පාසල් පාදක ගුරු සිතියම්ගතකරණය සඳහා සමස්ත පාසල් පද්ධතිය වෙනම ගොනුවන පරිදි ගුරු අවශ්‍යතා හඳුනාගැනීම, නියැදි පාසල් සඳහ 748ක් හඳුනාගෙන ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම හා ඒ අතුරින් ගුරු හිගය හා ගුරු අතිරික්ත සහිත පාසල් සඳහා ගන්නා පියවර ලැයිස්තුගත කිරීම, 2018/2019 හඳුනාගත් පාසල් 600ක් අතුරෙන් පාසල් 400ක් පමණ ජාතික පාසල් බවට පත්කිරීම ආදිය සිදුකර ඇත. |
| DLI 5 | ♦ නව විෂයමාලා සමග අනුගතවන පරිදි උපදේශනාත්මක නායකත්ව මොඩියුල සකස්කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය මගින් මොඩියුල සංරචක සඳහා අනුමැතිය ලබාදීම හා ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය ලේකම්තුමාගේ අධීක්ෂණය යටතේ මොඩියුල රාමුව සකසා අවසන් කිරීම.<br>♦ නව මොඩියුල සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමට අවශ්‍ය සම්පත් පුද්ගලයන් හඳුනාගැනීම හා විදුහල්පතිවරුන් හා නිළධාරීන් පුහුණු කිරීමේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම.<br>♦ නවෝත්පාදන විද්‍යාගාර, සම්මිශ්‍රිත ඉගෙනුම් සඳහා පළාත් මට්ටමෙන් සැලසුම් සැකසීම හා පාසල් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ වැඩ කටයුතු ආරම්භ කර ඉදිරියට සිදුකිරීම. |
| DLI 6 | • අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන ආයතන අතර ක්‍රියාකාරකම් පාදක සහභාගීත්ව ගිවිසුම සකස් කිරීමට අදාළව මූලික ඉලක්ක 13ක් හඳුන්වා දී පළාත් 9 සඳහා කෙටුම්පත් සකසා අවසන් කර කමිටු නිරීක්ෂණ ලබා ගෙන ඇති අතර එක් පළාතක් සඳහා රු.මි.5 බැගින් ලබා දීමට නීති උපදෙස් ලැබී ඇත |
| DLI 7 | ♦ අධ්‍යාපන පද්ධතිය සඳහා නියාමන හා ඇගයීම් රාමුවක් හඳුන්වාදීමේ වැඩකටයුතු සඳහා කමිටුව පිහිටුවා පළාත්වල දැනට නියාමනය සිදුවන ආකාරය පිළිබඳ සමීක්ෂණයක් සිදු කර උපදේශකවරුන්ගේ සහය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංයේ හා පළාත් සැලසුම් නිලධාරීන්ගේ දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වා නියාමනය හා ඇගයීම් අනුව සකස් කිරීම සිදු කරමින් පවතී.<br>♦ NEMIS ක්‍රියාකාරි සැලැස්මට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ සැපයීම සිදුකරමින් පවතී. අධ්‍යාපන පර්යේෂණ උපදෙස් සංග්‍රහය සඳහා මූලික කටයුතු සකස්කර අවසන් කර ඇත. |

**2022 වර්ෂයට නියමිත වැඩ කටයුතු :**

- NSAF සහ නව විෂයමාලා මත පදනම්ව තෝරාගත් විෂයන් සඳහා නව තක්සේරු මොඩියුල සංවර්ධනය කිරීම.

- 21වන සියවසේ කුසලතා සහ ශ්‍රම වෙළඳපල අවශ්‍යතා ඒකාබද්ධ කරන මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයක් සඳහා නව STMP විෂයමාලාව තක්සේරු ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ජාතික මාධ්‍ය ව්‍යාපාරය පිහිටුවීම.

- ජාතික හා පළාත් ව්‍යවහාරික සම්පත් මධ්‍යස්ථානවල (Applied Resource Hub) 50%ක කාර්යය මණ්ඩලය හා පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- තෝරාගත් විෂයන් සඳහා 10 ශ්‍රේණියේ ගුරුවරුන්ගේ 80% ක් විමර්ශනය පදනම් කරගත් අන්තර් ක්‍රියාකාරී ඉගැන්වීම්, මිශ්‍ර ඉගෙනුම් හා ප්‍රතිකර්ම ඉගැන්වීම් සඳහා පුහුණු කිරීම.


- අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව තෝරාගත් විෂයධාරා හා විෂයන් සඳහා අ.පො.ස. (සා.පෙළ) ගුරු සංඛ්‍යාව 70% කින්ද, අ.පො.ස. (උ.පෙළ) ගුරු සංඛ්‍යාව 40% කින්ද ඉහළ නැංවීම.

- උපදේශන නායකත්වය සඳහා තෝරාගත් පාසල්වල විදුහල්පතිවරුන්, නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරු 50%ක්, පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන නිලධාරීන් සහ ගණිතය හා විද්‍යාව ගුරු උපදේශකවරුන් 50%ක් පුහුණු කිරීම.

- STMC විෂයන්වල ඉගෙනුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම, STMC විෂයන් සඳහා ගැහැණු ළමුන්ගේ සහභාගිත්වය වැඩිකිරීම, පිරිමි ළමුන්ගේ පාසල් අතහැර යාම අඩු කිරීම ආදිය සඳහා තෝරාගත් පාසල් 20%ක තිරසර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පළාත් හා ජාතික ක්‍රියාකාරී සැලසුමට හා ප්‍රමුඛතා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රවලට සහය වීම සඳහා පළාත් 9හි ම කාර්යසාධනය පදනම් කරගත් හවුල් ගිවිසුම් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.

- අධ්‍යාපන පද්ධති අධීක්ෂණ ආකෘති අර්ථ දැක්වීම සහ මාර්ගෝපදේශ අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් හා කලාප මට්ටමින් ප්‍රමිතිගත කිරීම හා දත්ත පද්ධතියේ ප්‍රමිතිය සංවර්ධන කිරීම.


සංයෝජන පරිපථ
Combinational Circuits
utput depends only on the input of that
ime.
x: Half Adder, Full Adder, Multiplexor, Decod





2021


DEPARTMENT OF
GOVERNMENT INFORMATION


Next
THE DIGITAL PLATFORM


ගුරුගෙදර
A/LEVEL
සිංහල මාධ්‍ය
රසායන විද්‍යාව
පාඩම - 15




Geography
Your internet connection is unstable

## 06. කෝවිඩ් -19 වසංගත තත්වය හමුවේ දරුවන්ගේ අධ්‍යාපනය පසුබෑමට ලක් නොවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද හඳුන්වාදීමේ අභියෝගය හමුවේ අනෙකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා එක්ව අමාත්‍යාංශ මට්ටමින් පළාත්, කලාප හා පාසල් සම්බන්ධීකරණය කර ගනිමින් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවා ඇත.

- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පසුබෑමකින් තොරව කර ගෙන යෑම සඳහා "ගුරු ගෙදර " රූපවාහිනී වැඩසටහන, e-තක්සලාව හරහා වීඩියෝ පාඩම් ලබා දීම හා චිෂන් FM ගුවන්විදුලි නාලිකාව ඇරඹීම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මැදිහත් වීම මත සිදු කරන ලදි. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ලබා දෙන ලදි.
- අධ්‍යාපනය වෙනුවෙන් රූපවාහිනී නාලිකා 20ක් ආරම්භ කිරීමේ වැඩසටහනෙහි පළමු පියවර වශයෙන් රූපවාහිනී නාලිකා 06ක් මේ වන විට ආරම්භ කර ඇති අතර ජාතික අධ්‍යාපන ආයතනයේ මැදිහත් වීමෙන් වීඩියෝ වැඩසටහන් 7000කට අධික ප්‍රමාණයක් පටිගත කිරීම අවසන් කර ඇත. .
- පාසල් තොරතුරු තාක්ෂණයෙන් බලගැන්වීමේ අරමුණ ඇතිව පාසල් සඳහා පරිගණක උපාංග හා අන්තර්ජාල පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙළක් තොරතුරු තාක්ෂණ ශාඛාවේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක විය.
- සෑම විෂයයක්ම ආවරණය වන පරිදි ස්වයං ඉගෙනුම් කට්ටල සකස් කිරීම හා නිවෙස් පාදක අධ්‍යාපනයට මුලපුරන මොඩියුල සකස් කිරීම ආරම්භ කර ඇත.

### 2021 වර්ෂයේ පාසල් පැවැත් වූ ආකාරය

- 2021 වර්ෂය සඳහා පාසල් අදියර කිහිපයක් යටතේ පහත දැක්වෙන ආකාරයට ආරම්භ කරන ලදි.
  - බස්නාහිර පළාත හා හුදකලා කර ඇති ප්‍රදේශවල පිහිටි පාසල් හැර අනෙක් පළාත්වල පිහිටි පාසල් ජනවාරි 11 වන දින ආරම්භ කරන ලදි.
  - 2021 මාර්තු මස පැවැත්වීමට නියමිත, 2020 - අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටින සියලු ම සිසුන්ගේ අධ්‍යයන කටයුතු 2021.01.25 දින ආරම්භ කරන ලදි.

    එම සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දීම අවශ්‍ය වන බැවින්, ඒ සඳහා ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන්නේ නම්, 6,7,8 හා 9 ශ්‍රේණිවල සිසුන් කණ්ඩායම් ලෙස වරින් වර ගෙන්වා ගැනීමට කටයුතු කළ හැකි බවට වැඩිදුරටත් දන්වන ලදි. (බස්නාහිර පළාත හැර)
  - බස්නාහිර පළාතෙහි (හුදකලා කර ඇති ප්‍රදේශවල පිහිටි පාසල් හැර අනෙක් ප්‍රදේශවල) පිහිටි පාසල්වල 5,11 හා 13 ශ්‍රේණි පමණක් 2021.03.15 දින ආරම්භ කරන ලදි.
  - බස්නාහිර පළාතෙහි (හුදකලා කර ඇති ප්‍රදේශවල පිහිටි පාසල් හැර අනෙක් ප්‍රදේශවල) පිහිටි පාසල්වල සියලුම ශ්‍රේණි 2021.03.29 දින ආරම්භ කරන ලදි.
  - 2021.04.09 දින සියලුම පාසල්වලට පළමු පාසල් වාරය සඳහා නිවාඩු ලබාදෙන ලද අතර, 2021.04.19 දින සියලුම සිංහල හා දෙමළ පාසල් දෙවන වාරය සඳහා ආරම්භ කරන ලදී.
  - කොවිඩ් 19 වසංගත තත්ත්වය නැවතත් වර්ධනය වීම හේතුවෙන් 2021.04.27 වන දින සිට සියලු ම පාසල් සඳහා නිවාඩු ලබා දෙන ලදි.

ඉදිරියේ දී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ආකාරය

- නැවත පාසල් පරිසරයට දරුවන් අනුගත කර ඔවුන්ගේ මානසික සෞඛ්‍ය ඔප්නැංවීමට සුදුසු ක්‍රියාකාරකම් කිරීමට මූලිකත්වය ලබා දී කටයුතු කළ යුතු බැවින්, පාසල ආරම්භ කළ වහාම විභාග කටයුතු සහ තරග සඳහා ළමයින් යොමු නොකරන ලෙස දන්වන ලදි.

- පුද්ගල දුරස්ථභාවය ආරක්ෂා වන සේ පහත සඳහන් පරිදි පන්ති පැවැත්විය යුතු බවට ද අවධාරණය කරන ලදි.

| පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව | පන්ති පැවැත්විය යුතු ආකාරය |
|---|---|
| සිසුන් 15 දක්වා | සෑම දිනකම සියලු පන්ති පැවැත්වීම. |
| සිසුන් 16 සිට 30 දක්වා | පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර සතියක් හැර සතියක් පන්ති පැවැත්වීම. |
| සිසුන් 30 ට වැඩි | සිසුන් 15 බැගින් කණ්ඩායම් කර සමාන දින සංඛ්‍යාවක් වන සේ පන්ති පැවැත්වීම. |

- පාසල් මට්ටමින් තීරණ ගැනීම

  විදුහල්පති ප්‍රධානත්වයෙන් යුතුව, පාසල් සංවර්ධන විධායක කමිටුව හා සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව එක්ව පහත නිලධාරීන් ද සම්බන්ධ කර ගනිමින් පිහිටුවනු ලබන ප්‍රධාන කමිටුවට පාසල ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සියලු තීරණ ගැනීමේ බලතල පවරන ලදි. යම් ගැටළුකාරී අවස්ථාවක් වේ නම් වැඩිදුර උපදෙස් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත යුතු බව දන්වන ලදි.

  - ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
  - මහජන සෞඛ්‍ය පරීක්ෂක
  - ග්‍රාම නිලධාරි
  - පොලිසිය
  - ප්‍රාදේශීය ප්‍රවාහන අධිකාරි නියෝජිතයන්

- අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල පාසලට කැඳවීම

  - පාසල් අදියර වශයෙන් ආරම්භ කළ හෙයින් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශයන්ට අනුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව කර ගෙන යාම සඳහා අවශ්‍ය පරිදි කැඳවන ලෙස උපදෙස් ලබා දෙන ලදි.

  - මෙහි දී, පහසුකම් හා හැකියාව ඇත්නම් සේවයට නොකැඳවන අධ්‍යයන කාර්ය මණ්ඩලය මාර්ගගත ක්‍රමයට ඉගැන්වීමේ කටයුතු කිරීමටත්, එම කාර්ය මණ්ඩලයේ නොපැමිණීම ඔවුන්ගේ පෞද්ගලික නිවාඩුවලට හිලව් නොකරන ලෙසත් උපදෙස් ලබා දී ඇත.

- ප්‍රවාහන පහසුකම්

  පාසල් සිසුන් සඳහා සැපයෙන ප්‍රවාහන පහසුකම් විධිමත් කරවාලීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති අංක **ED/01/02/05/01/89** හා **2021.01.06** දිනැති ලිපියෙහි සඳහන් පරිදි සිසු සිසුවියන්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමට කටයුතු කළ හැකි අතර, ඒ සඳහා වැදගත් වන දුරකථන අංක කිහිපයක් ලබා දෙන ලදි.

- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් **2020.05.11** දින නිකුත් කොට ඇති අංක **15/2020** දරණ කොවිඩ් **19** පැතිරීම වැළැක්වීම සඳහා පාසල් සහ අධ්‍යාපන ආයතන සූදානම් කිරීම චක්‍රලේඛයේ සඳහන් නියමයන් හා මඟපෙන්වීම් ද අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අංක **ED/01/21/07/03/2020 (III)** හා **2021.01.04** දිනැතිව නිකුත් කරන ලද කොවිඩ් **19** වසංගත තත්වය යටතේ සෞඛ්‍යාරක්ෂිතව

පාසල් ආරම්භ කිරිම සඳහා වූ උපදෙස් හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ලබාදී ඇති උපදෙස් ද අනුගමනය කළ යුතු බව සඳහන් කර ඇත.

**රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ 2021 වර්ෂය සඳහා නැවත විවෘත කිරීමට සැලසුම් කිරීම.**

- එය සියලු ම ගුරුවරුන් හා අනධ්‍යන කාර්යය මණ්ඩල එන්නත්කරණය කිරීමෙන් අනතුරුව සිසුන් 200ට අඩු ප්‍රාථමික පාසල් ඔක්තෝම්බර් මස 21 වන දින ආරම්භ කිරිමට සැලසුම් කර ඇත.
  මෙහි දී, මීට පෙර ලබා දෙන ලද උපදෙස් යාවත්කාලීන කර පහත දැක්වෙන පරිදි කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.

- ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින්, තාක්ෂණික කමිටු තීරණ මත පහත පරිදි අදියර වශයෙන් පාසල් ආරම්භ කරනු කළ යුතු වේ.

| | |
|---|---|
| අදියර 01 | ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට අඩු පාසල්වල ප්‍රාථමික අංශ |
| අදියර 02 | ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට වැඩි පාසල්වල ප්‍රාථමික අංශ හා ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට අඩු පාසල්වල සියලු ම ශ්‍රේණි |
| අදියර 03 | සියලු ම පාසල්වල 10,11,12,13 ශ්‍රේණි සහ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 200ට අඩු පාසල්වල සියලු ම ශ්‍රේණි |
| අදියර 04 | සියලු ම ශ්‍රේණි සඳහා පාසල් විවෘත කිරීම |

ඒ අනුව, ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන ක්ෂේත්‍ර තුන පිළිබඳව අවධානය යොමු කරමින් පාසල් නැවත ආරම්භය සඳහා කටයුතු කෙරේ. එනම්,

1. පාසල ආරම්භ කිරීමට අදාළ පෙර සූදානම

   මෙහි දී දිස්ත්‍රික් සංවර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු සම්බන්ධීකරණයෙන් ඒ ඒ පාසල් ආරම්භ කිරීමට අදාළ සැලසුම් සකස් කිරීමේදී සිය පළාතට අදාළව කාර්යයන් සම්බන්ධිකරණය කිරීමේ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පවරන ලදි.

2. ඉගෙනුම් පරිසරය සෞඛ්‍යාරක්ෂිතව සූදානම් කිරීම

ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පන්ති කළමනාකරණය පිළිබඳ සැලසුම

| පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව | පන්ති පැවැත්විය යුතු ආකාරය |
|---|---|
| සිසුන් 20 දක්වා | සෑම දිනක ම සියලු පන්ති පැවැත්වීම. |
| සිසුන් 21 සිට 40 දක්වා | පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර සතියක් හැර සතියක් පන්ති පැවැත්වීම. |
| සිසුන් 40 ට වැඩි | සිසුන් සමාන කොටස් තුනකට වෙන්කර පන්ති පැවැත්වීම. පුද්ගල දුරස්ථභාවය පවත්වාගත හැකි නම් කොටස් දෙකකට වෙන්කර පන්ති පැවැත්වීම. |

මෙහි දී ශිෂ්‍ය කණ්ඩායම් මිශ්‍ර නොවන පරිදි (ජෛව බුබුළු ක්‍රමවේදය අනුව) කටයුතු කිරීමට වගබලා ගත යුතු බව වැඩිදුරටත් දන්වන ලදි.

3 ඉගෙනුම් පරිසරයට අනුගතවන සේ ළමා මනස සූදානම් කිරීම

"සතුටු හෙටක් ගොඩනගන්න, ආයෙත් මම ඉස්කෝලේට" යන සිසුන්ගේ මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා වන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දීර්ඝ කාලයක් සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාපටිපාටියෙන් බැහැරව නිවෙස්ගතව අධ්‍යයන කටයුතු වල නිරතවූ, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආතතිය දුරුකර මානසික සෞඛ්‍ය ඉහළ නැංවීමේ වැඩසටහන් "සතුටු හෙටක් ගොඩනගන්න, ආයෙත් මම ඉස්කෝලේට", ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර පළමු සතිය තුළ ක්‍රියාත්මක කළ යුතු බවට උපදෙස් ලබා දී ඇත.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් සහිත මාර්ගෝපදේශ පසුව ලබා දෙනු ඇත.

# 07. මූල්‍ය ප්‍රගතිය

**7.1 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් ( 2021.08.31 දිනට) - පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය**

| වැඩසටහන | 2021 ඇස්තමේන්තුව (රු.මි.) | 2021.08.31 දිනට වියදම (රු.මි.) |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 10.00 | 3.13 |
| ආයතන හා පරිපාලන කටයුතු | 450.00 | 70.24 |
| උසස් අධ්‍යාපන අංශය | 2000.00 | 900.65 |
| ප්‍රාථමික අධ්‍යාපනය | 468.62 | 256.62 |
| විශේෂ අධ්‍යාපනය | 120.00 | 4.14 |
| ගුරු සංවර්ධන රාමුව | 500.00 | 138.18 |
| සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | | |
| - විදේශ ආධාර | 3,143.00 | 118.58 |
| - දේශීය | 2,039.15 | 341.80 |
| උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 9,550.00 | 5,545.52 |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ආයතනික සහය ලබා ගැනීම | 800.00 | 152.50 |
| එකතුව | 19,080.77 | 7,531.36 |

මූලාශ්‍රය : විවිධ ගිණුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**7.2 අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් (2021.08.31) - පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය**

| වැඩසටහන | 2021 ඇස්තමේන්තුව (රු.මිලියන) | 2021.08.31 දිනට වියදම (රු.මිලියන) |
|---|---:|---:|
| අමාත්‍ය කාර්යාලය | 30.00 | 15.89 |
| ආයතන හා පරිපාලන කටයුතු | 1,297.3 | 787.22 |
| ආයතන හා පරිපාලන - උසස් අධ්‍යාපන අංශය | 584.00 | 171.73 |
| ප්‍රාථමික අධ්‍යාපනය | 5,403.5 | 3,430.66 |
| ද්විතීයික අධ්‍යාපනය | 29,213.6 | 19,002.60 |
| විශේෂ අධ්‍යාපනය | 2,330.35 | 1,516.75 |
| ගුරු සංවර්ධනය - ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 439.65 | 250.46 |
| ගුරු සංවර්ධනය - ජාතික විද්‍යාපීඨ | 2,331.20 | 1,273.10 |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ආයතනික සහය ලබා ගැනීම | 1,894.00 | 980.9 |
| එකතුව | 43,523.60 | 27,429.30 |

මූලාශ්‍රය : මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

# 08. ශිෂ්‍ය සාධනය


## 8.1 පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2015 – 2020)**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 333,672 | 343,757 | 350,462 | 350,191 | 332,179 | 326,264 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 76.33 | 75.67 | 69.40 | 79.09 | 78.10 | 86.83 |
| මධ්‍යන්‍ය ලකුණු | 109.50 | 107.86 | 106.43 | 117.98 | 114.38 | 125.65 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2015 – 2020)**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

## 8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය


**අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2015 – 2020)**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 273,224 | 286,251 | 296,812 | 296,029 | 305,427 | 308,126 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 189,428 | 200,208 | 216,815 | 222,281 | 225,539 | 231,452 |
| සමත් ප්‍රතිශතය % | 69.3 | 69.9 | 73.0 | 75.1 | 73.84 | 75.1 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

**පළාත් අනුව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2019 – 2020)**

| පළාත | 2019 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % |
| දකුණ | 38,180 | 29,898 | 78.31 | 38695 | 31,113 | 80.41 |
| වයඹ | 35,669 | 26,849 | 75.27 | 36286 | 27.283 | 75.19 |
| බස්නාහිර | 79,835 | 60,671 | 76.00 | 80849 | 60,789 | 75.19 |
| ඌව | 21,041 | 14,761 | 70.15 | 21086 | 15,812 | 74.99 |
| මධ්‍යම | 40,717 | 28,886 | 70.94 | 41262 | 30,812 | 74.67 |
| සබරගමුව | 28,683 | 21,513 | 75.00 | 28836 | 21.498 | 74.55 |
| උතුරු මැද | 20,465 | 14,690 | 71.78 | 20796 | 15,428 | 74.19 |
| නැගෙනහිර | 24,215 | 17,012 | 70.25 | 23739 | 17,183 | 72.38 |
| උතුර | 16,622 | 11,259 | 67.74 | 16577 | 11,534 | 69.58 |
| මුළු එකතුව | 305,427 | 225,539 | 73.84 | 308126 | 231,452 | 75.12 |





මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව


## 8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය


**අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2016 - 2020**


| | 2016 | 2017 | 2018 | 2019 (නව නිර්දේශය) | 2019 (පැරණි නිර්දේශය) | 2020 (නව නිර්දේශය) | 2020 (පැරණි නිර්දේශය) |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 211,865 | 206,630 | 218,191 | 173,781 | 61,769 | 251,168 | 24146 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව | 134,238 | 136,421 | 141,172 | 108,353 | 46,552 | 165,711 | 15,960 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 63.36 | 66.02 | 64.70 | 62.35 | 75.36 | 65.98 | 66.10 |


**එක් එක් විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය**
**( පළමු වරට පෙනී සිටින 2016 - 2020)**









මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

# 09. අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

## 9.1 ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය

**2021.08.31 දිනට ප්‍රගතිය**

- යොවුන් සාහිත්‍ය කෘති ඇගයීම සඳහා නිර්ණායක මාලාව සකස්කර එය පර්යේෂණයට ලක් කිරීම.
    - සහභාගිවූවන්ට සහතික පත්‍ර බෙදාදීම හා ඉදිරි සැසි පිළිබඳ දැනුවත් කිරීම ද අනුග්‍රාහකයන්ගේ ආධාර ඇතිව අවසන් කර ඇත.
- තෝරාගත් සිංහල හා දෙමළ කෙටිකතා 12ක් පරිවර්තනය කර භාෂාව සංස්කරණය කර වෙළුම් දෙකක් ලෙස සැකසීම.
    - කෙටිකතා පරිවර්තනය කර මුද්‍රණයට සකස් කර ඇත.
- "පොත් කියවන්නෝ දිවිය දිනන්නෝ" කියවීම් ප්‍රවර්ධන වැඩසටහන
    - පූර්වගාමීව පාසල් සිසුන් අතර චිත්‍ර තරඟයක් පවත්වා ජයග්‍රාහකයින් තෝරා ඇත.
- තෝරාගත් පොත්හල් සඳහා ගුරුළුගෝමී සම්මානය ප්‍රදානය කිරීම.
    - පොත්වල ගුණාත්මකභාවය මැනීමේ නිර්ණායක මාලාවක් පිළියෙල කිරීම.
- මාණ්ඩලික රැස්වීම් 06 ක් පවත්වා අනුමත කර ගත් මණ්ඩල පත්‍රිකාවලට අනුව නව වැඩසටහන් ආරම්භ කිරීම.
- නිර්මාණාත්මක අධ්‍යාපනික මෙවලමක් වශයෙන් ශ්‍රව්‍ය පොත් හඳුන්වාදීමේ වැඩසටහන සඳහා සංදර්භය හඳුනා ගැනීමට රැස්වීම් පැවැත්වීම.

**2022 වර්ෂයේ සැලසුම්**

- යොවුන් සාහිතය කෘති සඳහා සකස් කළ නිර්ණායක මාලාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම.
- සිංහල හා දෙමළ පරිවර්තිත කෙටිකතා සංග්‍රහ දෙක මුද්‍රණයෙන් දොරට වැඩීම හා පාසල් පුස්තකාල වෙත බෙදා හැරීම.
- පොත් කියන්නෝ - දිවිය දිනන්නෝ කියවීම් වැඩසටහන ප්‍රවර්ධන කිරීම.
- නිර්මාණාත්මක අධ්‍යාපනික මෙවලමක් වශයෙන් ශ්‍රව්‍ය පොත් හඳුන්වාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ලේඛනයේ දක්ෂතා දක්වන තෝරාගත් සිසු ලේඛක -ලේඛිකාවන්ගේ දක්ෂතා ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළු පැවැත්වීම.

## 9.2 ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

**2021.08.31** දිනට ප්‍රගතිය

- ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සහකම්පනය (Learning for Empathy)
  - සියලුම පාසල් ළමුන්, ගුරුවරුන් හා විදුහල්පතිවරුන් සම්බන්ධීරකණය කර ගනිමින් වැඩමුළු දෙකක් පවත්වා ඇත.
  - ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සහකම්පනය පිළිබඳ අත්පොත මුද්‍රණය කර ඇත.
  - වැඩමුළුව වෙනුවෙන් වැඩමුළුවට අදාළව ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සහකම්පනය පිළිබඳ වාර්තාව මුද්‍රණය කිරීමට නියමිතය.
- ඉනික්කි ෆෙස්ටා චිත්‍ර තරගය (Enikki Festa Art Competition)
  - ජපානයේ යුනෙස්කෝ ජාතික සම්මේලනය හා එක්ව මෙම කොමිෂන් සභාව මගින් මෙම චිත්‍ර තරගය සංවිධානය කරනු ලබන අතර පාසල් මට්ටමින් අප වෙත ලද චිත්‍ර 3000ක් අතරින් මුලික වටයේ දී චිත්‍ර 300ක් ද දෙවන වටයේ දී චිත්‍ර 8ක් තෝරා ගනු ලැබිය. අවසාන වටයෙන් තෝරා ගනු ලැබූ චිත්‍ර ජපානය වෙත යවන ලද අතර ඉන් Grand frixed winner ලෙස සංදේස් ලක්දුල ශිෂ්‍යයා තේරී පත්ව ඇත. ඔහුට හිමි මුදල් ත්‍යාග හා සෙසු ත්‍යාග ලබා දී ඇත. අවසන් වටයේ සියලු දෙනා වෙත ද ත්‍යාග ලබා දී ඇත.
- ලෝක උරුම පිළිබඳ කාලීන වාර්තාකරණයට අදාළව ස්ථානීය කළමනාකරුවන් වෙත ලබා දෙනු ලබන ප්‍රශ්නාවලිය සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම.

  (Third cycle of periodic reporting in the region of asia and the pacific)
  - ලෝක උරුම කමිටුව විසින් ඉදිරිපත් කර ඇති ලෝක උරුම පිළිබඳ කාලීන වාර්තාකරණය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම සඳහා එවන ලද ප්‍රශ්නාවලිය 2 කොටස හා ලෝක උරුම ස්ථානීය කළමනාකරුවන් සඳහා භාවිතා කිරීමට එවන ලද අත්පොත දෙමළ හා සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත. අදාළ පාර්ශවයන්ට ලබා දී ඇත.
- යුනෙස්කෝ සහභාගිත්ව වැඩසටහන (Participation Programme)
  - ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව විසින් ගෙන්වා ගනු ලබන ව්‍යාපෘති වාර්තා, යුනෙස්කෝ මුලස්ථානය මගින් අනුමැතිය ලබා දී, තෝරා ගැනීමකට ලක් කළ ව්‍යාපෘති පහ 2021-2022 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කර ඇත.
  - අදාළ ව්‍යාපෘති සම්බන්ධයෙන් පාර්ශව හා සමග සාකච්ඡා පවත්වා ඇත.

**2022** වර්ෂයේ සැලසුම්

- යුනෙස්කෝ සහභාගිත්ව වැඩසටහන සඳහා මුල්‍ය පහසුකම් සැපයීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මෙහෙයුම් ක්‍රියාවලිය සිදු කිරීම .
- ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සහකම්පනය වැඩසටහන සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ හා ප්‍රකාශන තුළින් සහකම්පන සංකල්පය පාසල් තුළ ප්‍රසාරණය කිරීම .
- විද්‍යා විෂය පාසල් පද්ධතිය තුළ ප්‍රවර්ධනය කිරීමට වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම හා ප්‍රකාශන එළ කිරීම

- ඒකාබද්ධ පාසල් ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට බාහිර ලෝකය පිළිබඳ දැනුම ලබා ගැනීමට පාසල් විෂය රාමුව තුළ පන්ති කාමරය ඇතුළත සංවිධානය වූ ක්‍රියාවලියට සහය වෙමින් සියලුම වයස්වලට අයත් සිසුන්ගේ අදහස්වලට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් අතර හා අනෙකුත් රටවල්වල පාසල් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහයෝගීතාවය ඇති කිරීම සහ පාසල් ප්‍රජාවගේ අවට පරිසරයේ ආරක්ෂාව හා සුරක්ෂිතතාව ඇති කිරීම.

- පාසල් ඉංග්‍රීසි ගුරුවරුන් සවිබල ගැන්වීම යටතේ ඉංග්‍රීසි විෂයට අදාළ දැනුම, කුසලතාව සංවර්ධනය කිරීම

- අස්පෘශ්‍ය සංස්කෘතික උරුම රැක ගැනීමට අදාළ කටයුතු සිදු කිරීම.

- නව ලෝක උරුමයන් පිළිබඳ වැඩමුළු හා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.

- සදාචාරාත්මක ශක්තිමත් නිදහස් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා යුනෙස්කෝ අරමුදල් භාවිතයෙන් පවත්වන වැඩමුළු පැවැත්වීම.

## 9.3 රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව

**2021.08.31** දිනට ප්‍රගතිය

- රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා ඉතිහාසය තුළ වැඩිම පෙළපොත් ප්‍රමාණයක් ( මිලියන 14.641) එනම් සම්පූර්ණ පෙළපොත් අවශ්‍යතාවයෙන් 45% කට ආසන්න පෙළපොත් ප්‍රමාණයක් 2021 වසර තුළදී මුද්‍රණය කර ඉලක්කගත දිනට දැයේ දරුවන් වෙත ලබාදීම .2021.09.30 ට නිමකර ඇති පෙළපොත් සඳහා වියදම රු.මිලියන 8.27කි.

- හරිත කර්මාන්තකරණ සංකල්පය යටතේ ක්‍රියාකරන 2021 වසරේ මුල් මාස 5 තුළ දී පමණක් භාවිතයෙන් ඉවත් කළ පොලිතින් මෙට්‍රික් ටොන් 1.45 පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීම.

- රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා ඉතිහාසය තුළ ප්‍රථම වරට ඩිජිටල් මුද්‍රණ සේවා සපයන නව සුහුරු වෙළඳසැලක් (SMART DIGITAL PRINTING OUTLET) නාරාහේන්පිට රාජවාස ගොඩනැගිල්ල තුළ ස්ථාපනය කිරීම.

- නව SPC ඩිජිටල් ලෝයල්ටි කාඩ් පත් සහ SPC ජංගම යෙදවුමක් දැයේ දරුවන් වෙත හඳුන්වා දීම තුළින් 30% වට්ටමක් යටතේ වෙළඳපොළ තුළ පවතින මිලට වඩා, වඩාත් සහනදායී මිලකට SPC නිෂ්පාදන දැයේ දූ දරුවන් වෙත ලබාදීමට හැකිවීම හා SPC වෙළඳපොළ 15% කින් පමණ වැඩි කර ගත හැකි වීම.

- නව ව්‍යවසාය සම්පත් සැලසුම් කරන පද්ධතියක් (ERP) ආයතනය වෙත හඳුන්වාදීම තුළින් සියලුම සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි කරගැනීමට හැකිවීම හා සියලුම අංශ තුළ මාර්ගගත ක්‍රමයට (Online) රාජකාරී ඉටු කිරීමට හැකිවීම.

- නව විචල්‍ය දත්ත මුද්‍රණ යන්ත්‍රයක් ස්ථාපනය කිරීම මගින් නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සහ නව ඵලදායීතා සංකල්ප හඳුන්වාදීම තුළින් ශ්‍රී ලංකාව තුළ ඉහළ ප්‍රමිතියකින් යුතු සුරක්ෂා මුද්‍රණ කටයුතු සිදු කිරීම හා ඒ සඳහා වෙනම ඒකකයක් පිහිටුවීමත් ඒ තුළින් දෛනික නිෂ්පාදනය 100% කින් වැඩි වීම.

- දැනට පවතින පාසල් පොත් මුද්‍රණ යන්ත්‍ර මෙන් දෙගුණයක නිෂ්පාදන ධාරිතාවයෙන් යුතු නවීන තාක්ෂණයෙන් යුත් වෙබ් මුද්‍රණ යන්ත්‍රයක් සවිකිරීම මගින් ඒකක පිරිවැය අඩු කිරීම.

    - නවීන තාක්ෂණයෙන් යුත් සිව් වර්ණ වෙබ් ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන සවිකිරීම මේවන විට සිදුකරන අතර එමගින් සමාන කාලයක් තුල නිෂ්පාදනය 100% කින් වැඩිවීම තුල පිරිවැය 50% කින් අඩු කිරීමට හැකිවනු ඇත. එමෙන්ම මෙම යන්ත්‍රයේ ඇති සවයංක්‍රියව කඩදාසි රෝල් මාරු කිරීමේ හැකියාව මත රෝල් මාරු කිරීමේදී කඩදාසි අපතේ යාම සාපේක්ෂව විශාල ලෙස අඩුවීම තුල වියදම අඩුවීම සහ රීල් මාරු කිරීම සඳහා ගතවන කාලය අවම විම තුල නිෂ්පාදනය වැඩි වීමද සිදුවේ.

- නවීන සිව්වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක් රජයේ ආධාර මත ඇණවුම් කිරීම මගින් (2021 දෙසැම්බර් 15 වනවිට ලැබීමට නියමිතයි) ඉහල ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් යුතුව ඕෆ්සෙට් මුද්‍රණ කටයුතු සිදු කිරීමේ හැකියාව ඇති කිරීම.

    - මෙම යන්ත්‍රය මගින් වර්ණ හතරම එකවර මුද්‍රණය වීම හේතුවෙන් මෙතෙක් අප සතුව තිබූ තනි වර්ණ හා ද්වි වර්ණ මුද්‍රණ යන්ත්‍රවලට වඩා අඩු මිනිස් පැය ප්‍රමාණයකින් මුද්‍රණ කටයුතු නිම කිරීමට හැකිවීම මත මුද්‍රණ පිරිවැය අඩු වීම හා එමගින් තරඟකාරී ලංසු මගින් ලබා ගතහැකි මුද්‍රණ කාර්යයන් වැඩි කර ගැනීමේ හැකියාව ලැබෙනු ඇත. ඒ තුළින් වාණිජ මුද්‍රණ කටයුතු ඉහල ප්‍රමිතියෙන් හා පෞද්ගලික ආයතන හා තරගකාරී මට්ටමින් සිදු කිරීමට හැකිවීම.

- රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතරින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජාත්‍යන්තරව පිළිගත් ද්‍රව්‍ය ප්‍රවාහ පිරිවැය ගිණුම්කරණ (MFCA) පද්ධතිය එනම්, ISO 14051:2011 සහතිකය ලබා ගැනිම සහ

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා ඉතිහාසය තුළ ප්‍රථම වරට තත්ත්ව කළමනාකරණ පද්ධතියක් එනම්, **ISO 9001:2015** හඳුන්වා දීම තුළින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික 2ක් ලබා ගැනීමට හැකිවීම.

**2022 වර්ෂයේ සැලසුම්**

ප්‍රධාන ඉලක්ක :-
i. **2023 පාසැල් පෙළ පොත් අවශ්‍යතාවයෙන් 50% සැපයීම.**

ii. **වාණිජ මුද්‍රණය ක්ෂේත්‍රයේ මුද්‍රණ කාර්යයන් 1200 ඉටු කිරීම.**

iii. **මිලියන 7.6 අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම.**

iv. **ටිකට්පත් මිලියන 640ක ලොතරැයිපත් මුද්‍රණය කිරීම.**

අරමුණු :-
i. **2023 පාසැල් පෙළ පොත් අවශ්‍යතාවයෙන් 50% කට නොඅඩු ප්‍රමාණයක් ජාතික කර්තවයක් හා වගකීමක් ලෙස සලකා නියමිත මුද්‍රණ කාල සීමාව තුළ මුද්‍රණය කර ලබාදීම.**

ii. **වාණිජ මුද්‍රණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ මුද්‍රණකරු වීම හා රාජ්‍ය ආයතනයන්ගේ මුද්‍රණ අවශ්‍යතාවයන් සපයන්නා බවට පත් වීම.**

iii. **දැයේ දූ දරුවන් වෙත ප්‍රමිතියෙන් උසස් අභ්‍යාස පොතක් වෙළඳපොල අවම මිල ගණන් යටතේ ලබාදීම.**

iv. **ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන මුද්‍රණ පාර්ශ්වකරු වීම හා ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ප්‍රමුඛව සුරක්ෂා මුද්‍රණ අවශ්‍යතාවයන් සපයන්නා බවට පත් වීම.**

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

| වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාල රාමුව | දර්ශක (KIP) | ඇස්තමේන්තු ගත මුදල (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| ප්‍රධාන මුද්‍රණාලය | පාසැල් පෙළ පොත් මුද්‍රණය | අප්‍රේල් 1 සිට නොවැම්බර් 30 දක්වා | පොත් මිලියන 16.5 | 1450 |
| ප්‍රධාන මුද්‍රණාලය | වාණිජ මුද්‍රණ කටයුතු | ජනවාරි 01 සිට දෙසැම්බර් 31 | මුද්‍රණ කාර්යයන් 1200 | 350 |
| ලිපිද්‍රව්‍ය කම්හල | අභ්‍යාස පොත් නිෂ්පාදනය | ජනවාරි 01 සිට දෙසැම්බර් 31 | පොත් මිලියන 7.5 (80 Page) | 300 |
| සුරක්ෂා මුද්‍රණය | ලොතරැයි මුද්‍රණය | ජනවාරි 01 සිට දෙසැම්බර් 31 | ටිකට්පත් මිලියන 640 | 360 |

## 9.4 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

- පරිගණක ආශ්‍රිත සුචිගත කිරීම
    - Koha පුස්තකාල මෘදුකාංගය මගින් පරිගණකගත කිරීම තුළින් අත්පත් කරගන්නා ලද ප්‍රකාශන 3755 Koha දත්ත පදනමට ඇතුළත් කර තිබේ.
- ඩිජිටල් පුස්තකාල කටයුතු
    - ජාතික ඩිජිටල් පුස්තකාලයට ඇතුළත් කළ හැකි ඩිජිටල් සම්පත් විවිධ මූලාශ්‍ර ඔස්සේ හඳුනා ගැනීම හා එක්රැස් කිරීම යටතේ 2017/2018 වර්ෂවල ගැසට්පත්‍ර හා ලේක්හවුස්, උපාලි විජය පුවත්පත් ආයතනවල පුවත්පත් ඩිජිටල් පුස්තකාලයට එකතු කිරීම.
    - ජාතික ඩිජිටල් පුස්තකාලය වැඩිදියුණු කිරීම යටතේ මණ්ඩලයීය ප්‍රකාශන 16 ස්කෑන් කර පිටු 1509ක් DSpace දත්ත පදනමට upload කිරීම.
- තොරතුරු තාක්ෂණ කටයුතු
    - වෙනත් පුස්තකාල ස්වයංක්‍රියකරණය කිරීම හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ කොල්ලුපිටියේ පිහිටි ජාතික ආරක්ෂක විද්‍යායතනයේ නිලධාරීන් සඳහා Koha මෘදුකාංගය පිළිබඳ මාර්ගගත පුහුණුවීම් සිදු කිරීම.
- ප්‍රලේඛන කටයුතු
    - ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය කාලීනව ප්‍රකාශයට පත් කිරීම.
    - ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව ත්‍රෛමාසිකව සැකසීම .
    - ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව Koha දත්ත පදනම ඇසුරින් යාවත්කාලීන කිරීම යටතේ ජාතික පුවත්පත්වලින් සංලේඛ 2233ක තොරතුරු දත්ත පද්ධතියට ප්‍රවේශ කිරීම .
    - ප්‍රකාශන 101ක් සඳහා පළ කිරීම සඳහා ප්‍රකාශනගත සුචිකරණ දත්ත (CIP) ලබා දීම.
- සංරක්ෂණ කටයුතු
    - ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය ප්‍රතිෂ්ඨාපනය හා ලේඛන ප්‍රතිසංස්කරණය මානාව පවත්වාගෙන යාම තුළින් ප්‍රකාශන 530ක් ධූමායනය කිරීම, ප්‍රකාශන 09ක පිටු 828 ක් නිරාම්ලිකරණය කිරීම හා පිටු 216 ක් ටිෂූ දැමීම.
    - UNESCO MOW World List සඳහා මහාවංශය පුස්කොළ පොත ඇතුළත් කිරීම සඳහා සඳහා අදාළ සාකච්ඡා පවත්වා කටයුතු සිදු කිරීම.
    - කොරියාවේ ICHCAP ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ මෙරට අස්පර්ශණීය සංස්කෘතික උරුමයට අදාළ අවස්ථා විඩියෝ ගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.
- පර්යේෂණ කටයුතු
    - ජාතික පුස්තකාල පර්යේෂණ සම්මන්ත්‍රණයට අදාළ ලිපි විවිධ ආයතන වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු සිදු කිරීම. සම්මන්ත්‍රණය සඳහා IFLA ආයතනයේ අනුග්‍රහය ලබා ගැනීම සහ 2021 ඔක්තෝබර් 29 වන දින පැවැත්වීමට කටයුතු කිරීම .
    - ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ සංඛ්‍යානාමය අත්පොත සම්පාදනය කිරීම Statistical Handbook on Libraries in Sri Lanka (2021) යටතේ 2020 වර්ෂයට අදාළව රැස්කරගත් තොරතුරු විශ්ලේෂණය කොට මූලික තොරතුරු ඇතුළත් කිරීම.

- පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළු 08 ක් මාලාවක් පැවැත්වීම.

♦ ව්‍යාප්ති සේවා

- 2021 ජාතික කියවීමේ මාසය චක්‍රලේඛය සකස් කොට පළාත් පාලන ආයතන වෙත යොමු කිරීම.
- ජාතික කියවීමේ මාසය වෙනුවෙන් මාර්ගගත ක්‍රමයට සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම
- මණ්ඩලයීය ප්‍රකාශන යටතේ ජාතික ග්‍රන්ථ නාමාවලිය, ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව, ප්‍රලේඛා සඟරාව, පළාත් මධ්‍ය පුස්තකාල සංවර්ධනය යනාදි ප්‍රකාශන අලෙවි කිරීම.

♦ අධ්‍යාපන පුහුණු වැඩසටහන්

- Commonwealth of Learning ආයතනය විසින් ජාතික පුස්තකලෙ හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හරහා පැවැත්වෙන Skills online Sri Lanka ව්‍යාපෘතියේ මගපෙන්වීම් කටයුතු සිදු කිරීම.

♦ ප්‍රකාශන කටයුතු

- ලේඛකයින් දිරිගැන්වීම සඳහා ලේඛකයින්ගේ  මුද්‍රිත පිටපත් 361ක් සඳහා අනුග්‍රහය දැක්වීම.
- ජාත්‍යන්තර සමුළු පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා Natnet Lanka ප්‍රවෘත්ති පත්‍රිකාව සම්පාදනය කිරීම.
- රටතුළ ගුණාත්මක ප්‍රකාශන සුලභ කිරීම යටතේ ප්‍රමිති අංක නිකුත් කිරීමෙන් පළ කෙරෙන ප්‍රකාශන සඳහා අන්තර්ජාතික වටිනාකමක් ලබා ගැනීම.

**2022 වර්ෂයේ සැලසුම්**

♦ රු.මිලියන 150.0ක වියදමින් ජාතික පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කටයුතු අවසන් කිරීම.

♦ රු.මිලියන 3.0ක වියදමින් ග්‍රාමීය පුස්තකාල නවීකරණය කිරීම.